# පැරණි පුස්කොළ පිටපතකින් හෙළිවන ගර්භිණී චිකිත්සාවට අයත් නිදසුන් කිහිපයක්

- වයි. කේ. තිස්ස බණ්ඩාර

## ප්‍රවේශය

මෙම ලිපියට පදනම වූ පුස්කොළ පිටපත අනුලේඛන කරන ලදුව වර්තමාන ලේඛක නමින් මහාසම්මත ගර්භවිධිය හෙවත් ගර්භිණී චිකිත්සා මැයෙන් කෘතියක් සේරී ප්‍රකාශන ආයතනය විසින් මෑතක දී පළකරන ලදී (2019 මැයි මස). එය මුද්‍රිත පිටු සියයක පොතකි. අදාළ පුස්කොළ පිටපත මීට වසර පනහකට ප්‍රථම අභාවප්‍රාප්ත ආයුර්වේද වෛද්‍යාචාර්යවරයකුට අයත් වූ එකකි. එනම් අනුරාධපුර, නොච්චියාගම, බෝගහවැව පදිංචිව සිටි සිංහ ප්‍රතාපසිංහ රංගේ බණ්ඩාර දිසානායක මුදියන්සේලාගේ සුද්දහාමි වන්නිනායක දිසානායක මහතාගේ අත්වෙද පොත ය. එය ඇත්දත් කම්බ දෙකකින් ආවරණය වූ අඟල් අටක් පමණ දිග පිටපතකි. හුය සහිත එහි පත් ඉරු 138ක් අන්තර්ගතවිය. "ක, කා" ආදි ක්‍රමයට අංකනය කැර ඇති එම පිටපත කියවා ගැනීම අපහසුවිය. එහෙයින් ප්‍රථමයෙන්ම එම පිටපත කලු මැදීමට ලක් කෙළෙමි. එහි පළමු පත් ඉරුවේ මුල් පිටුවේ "මහාසම්මත ගර්භවිධිය" යනුවෙන් සඳහන්ව තිබිණ. මෙම පොත පිටපත් කිරීමේ දී ගර්භිණීන්ගේ රෝග සම්බන්ධයෙන් ඖෂධ හා ප්‍රතිකාර එහි ඇති බව තහවුරු විය. ආයුර්වේද සාහිත්‍යයේ වෙනත් කෘති කීපයක සඳහන් **"ගර්භිණී චිකිත්සා"** යන්නත් මෙම පිටපතේ **"මහාසම්මත ගර්භවිධිය"** අතරත් සමාන අසමානකම් ඇති බව විමසුම අනුව පැහැදිලි විය. ඉන් තෝරාගනු ලබන තොරතුරු සීමිත ප්‍රමාණයක් නිදසුන් වශයෙන් මෙයින් ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය.

## හැඳින්වීම

"භාරතයෙහි ආරම්භ වී වර්ධනය වූ වෛද්‍ය ශාස්ත්‍රය අසල්වාසි රටවලට ද බලපාන්නට වූ බවට සාධක බහුල ය. මෙම විවිධ ශාඛා අතරින් ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රචලිත භාවයට පත්වූයේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයයි. මහාචාර්ය සෙනරත් පරණවිතානයෝ 1934 දී භාරතීය

ජනතාව අතර ප්‍රචලිත වෛද්‍ය ක්‍රමය ම මෙරට මුල් ම වැසියන් විසින් භාවිත කරන ලද බවත් ලංකාවේ දේශීය වෛද්‍යවරුන් විසින් අනුගත ක්‍රමය වූයේ ආයුර්වේදය බවත් ප්‍රකාශ කළහ. ශ්‍රී ලංකාවේ දේශීය සාම්ප්‍රදායික වෛද්‍ය ඥානය බහුතර වශයෙන් රඳා පැවතුණේ සම්භාව්‍ය ඉන්දීය ආකෘතිය මතයි. සමහරු ආයුර්වේදය ආදිම ආර්‍ය්‍ය ජනපදිකයන් සමඟ මෙ රටට එන්නට ප්‍රථම රාවණා යුගයක පැවැති දේශීය වෛද්‍ය ක්‍රමයක් ගැනත් කියති"[1] ඔහු පවසන පරිදි වෛද්‍ය ශාස්ත්‍රය භාරතයෙහි ආරම්භ වූ බව ඉඳුරාම පැවසීම අසීරු ය. "සීතා - රාම කතාව බෞද්ධ දශරථ ජාතකයේ එයි. එහි රාවණා රාජයා ගැන කිසිම සඳහනක් නැත. ක්‍රි. පූ. සිවුවන සියවසේ සිවුවන කාර්තුව හරියේ බරණැස් නුවර විසූ බමුණු පඬුවන් පිළියෙල කළ සකු බසින් 18 වන සියවසේ දී ලියැවුණා කුඩා පොත් පහක කර්තෘත්වය ලංකාධිපති රාවණා කෙරෙහි පැවරී ඇත. බුද්ධ කාලයටත් අවුරුදු දහස් ගණනකට පෙර විසූවකු වශයෙන් හැඳින්වෙන රාවණා රාජයා අතින් මේ පොත් ලියැවුණේ නම්, මේ පොත්වල විකෘතතා බහුලවීම අනිවාර්‍ය්‍ය යයි. එහෙත් කිසිම විකෘතියක් ඒ එකෙකවත් නැත. එකෙකින්වත් එක අකුරක්වත් හැලී නැත. සවන සියවසේ දී ප්‍රසිද්ධ නාගාර්ජුන ස්වාමින්ද්‍රයන් සොයා දැනගත් රස ශාස්ත්‍රය හා නාඩිශාස්ත්‍රය දෙකත්, යුනානි වෛද්‍ය ක්‍රමය ආශ්‍රයෙන් හඳුනාගනු ලැබූ බේත් අරක්කු පෙරීම හා අබින් කංසා සීන අල ජයගපාල ආදියත් පිළිබඳ තොරතුරු අර්ක ප්‍රකාශනයෙහි ද, ඒ හිමියන් සොයාගත් නාඩි ප්‍රකාශනයෙහි ද එයි. මේවායේ නවීනත්වය ගැනත්, වෙනත් තොරතුරු ගැනත් සලකා බැලූ භාරතීය මහා පර්යේෂකයෝ අර්ක ප්‍රකාශාදිය 18වන සියවසට ඇද හෙළා රාවණා සම්බන්ධයෙන් ඉවත් කරති. රාවණා සම්බන්ධය ලැබුව ද ඕහට මෙහි ඇත්තේ කෘතිම පරිසරයකි. රාවණා රජතුමා පිළිබඳ කිසිම දෙයක් අපේ එකම වෙදපොතකවත් සඳහන් නොවේ. රාවණා රාජයාගේ නාමයෙන් අර්ක ප්‍රකාශාදිය රසැයි මෙන් ඔවුහු උගතුන් බලාපොරොත්තු වූයේ ආයුර්වේදයේ අද්භූත සමෘද්ධියකට ඉවහල් වූ රස ශාස්ත්‍රාදිය නිපදවීමේ ගෞරවය හින්දු ත්‍රිමූර්තියට හිමි කිරීමයි. එය ව්‍යර්ථ ප්‍රයත්නයක් වී ඇත. රාවණා කථාන්තරය මුළුමනින්ම භාරතීය සාහිත්‍යාගත ය."[2]

"භාරතීය වෛද්‍ය ක්ෂේත්‍රය අතිශය ව්‍යාප්ත වූවකි. එහි පහළව ව්‍යාප්ත වී ගිය වෛද්‍ය විද්‍යාව යන වෙනත් ශාඛා පහක් අප රට කෙරෙහි ද යම් යම් බලපෑම් කර තිබේ. ඒවා පිළිවෙලින් මෙසේ ය. ආයුර්වේද, යුනානික්‍රමය, සිද්ධ ක්‍රමය, එම්ෂි ක්‍රමය, ප්‍රකෘතික චිකිත්සා ක්‍රමය යි. මීට අමතරව හයවැනි වූ නාඩි වෙදකම පිළිබඳ අංශයක් ද ඇත. මේ ක්‍රම සියල්ලම මූලධර්ම අතින් ආයුර්වේදය හා සමාන වන නිසා ආයුර්වේදය ප්‍රබලත්වයට සහ ප්‍රධාන භාවයට ද පත් වී තිබේ."[3] බුදු දහම ද ආයුර්වේදය මෙන් භාරතයේ ප්‍රභවය වූ ශ්‍රේෂ්ඨතම දර්ශනයක් මෙන්ම ප්‍රතිපදා මාර්ගයකි. එහි ආදි කතෘවරයා වූ බුදුන්වහන්සේ සත්ත්වයා මුහුණපාන ප්‍රධාන ගැටලුව වන ජාති, ජරා, ව්‍යාධි, මරණ සංඛ්‍යාත දුක්ඛයාතවෙන ස්ථාවර විසඳුමක් ඉදිරිපත් කළ අතර එය නිර්වාණගාමී ප්‍රතිපදාව යනුවෙන් හඳුන්වනු ලැබේ. එහෙත් නිර්වාණගාමී ප්‍රතිපදාව හදිසියේ සම්පූර්ණ කළ හැක්කක් නොවේ. එය අනුපූර්ව ප්‍රතිපදාවකි. ඇතැම්විට ඒ සඳහා සසර දිගු කලක් පාරමී පිරිය යුතු ය. අවසාන පරමාර්ථය නිවණ වුව ද එය අනුගමනය කළ යුතු යැයි බලපෑමක් බුදුසමයේ නැත. එහෙත් සංසාරික ජීවිතය සාර්ථකව ගත කිරීමට අවශ්‍ය අංග සම්පූර්ණ උපදෙස් මාලාවක් බුදුසමය නිර්දේශ කර ඇත. එම උපදෙස් අනුගමනය කිරීම ලෞකික ජීවිතය සාර්ථක කර ගැනීමටත් නිර්වාණාවබෝධයටත් හේතුවේ. නිර්වාණවබෝධය සඳහා ප්‍රතිපත්ති පිරිය යුතු ය. ප්‍රතිපත්ති පිරීම රෝගාබාධ සහිතව කිසිසේත් කළ නොහැකි ය. එබැවින් ගිහි හෝ පැවිදි හෝ අනුගාමිකයන් අතර මනා සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. මේ නිසා බුදුන් වහන්සේ බොහෝ අවස්ථාවල නීරෝගීභාවයේ අගය පැහැදිලි කළ අතර විවිධ රෝගාබාධ සඳහා පිළියම් ද නියම කළහ. මෙම පිළියම් අතර අධ්‍යාත්මික හෙවත් මනෝචිකිත්සාව මෙන්ම ඖෂධමය චිකිත්සා ක්‍රමයන් ද රාශියක් දක්නට ලැබේ.[4]

භාරතයේ බුදුසමය ලක්දිවට හඳුන්වා දීමත් සමඟම බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෛද්‍ය ක්‍රම මේ දිවයිනෙහි ස්ථාපිත නො වූයේ යැයි පැවසිය නොහැකි ය. පෙළ දහමට අනුව න්‍යායාත්මක සහ ප්‍රායෝගික අංශයෙන් එහි ඇති වෛද්‍ය ක්‍රමය භික්ෂූන් වහන්සේ අතරත් ගිහි ප්‍රජාව අතරත් භාවිත වූයේ යැයි විශ්වාස කළ හැකි ය. එපමණක් ද නොව අශෝක මහරජු විසින් දේශ දේශාන්තරවල වෛද්‍ය සේවාව

ප්‍රචලිත කළ බවට ඔහුගේ ශිලා ලේඛන තොරතුරු සපයයි. එය මේ දිවයිනට ද බලපා ඇත. එම නිදර්ශනය මෙසේ ය.

"**සර්වත විජිතංහි දේවානම් ප්‍රියස ප්‍රියදසිනො රඤ්ඤො එවංපි - පච්චංතෙසු යදි චෝඩ පාංඩ සතියපුත කේරලපුත ආ තංබපංණි අංතයතො යෝනකරාජා යේවාපිතස අංතියේතස සාමීපං රාජානෝ සවීත දෙවානම්ප්‍රියස ප්‍රියදසිනො රඤො ද්වේ චිකිඡාකටා මනුජ චිකිඡාච එසු චිකිඡාචඖසධානි යානි මදුසොපගානිච එසොපගානිච.......**"[5] (ගිරිනාර් ලිපිය අංක 03). මෙහි සරල අදහස මෙසේ ය, සියලු තැන ජයගත් දෙවියන්ට ප්‍රිය වූ පියදසී රජුගේ රාජ්‍යයෙහි සියලු ස්ථානවල ද එසේ ම ප්‍රත්‍යන්තයන් වූ චෝළ - පාණ්ඩ්‍ය - සත්‍යපුත්‍ර - කේරලපුත්‍ර ආදියෙන් ඔබ්බෙහි වූ **තාම්බපර්ණයෙහි** ද සමීපය වන තියෝ අන් රජුගේ සහ අන්‍ය සමීප නරපතීන්ගේ රටවල ද දෙවියන්ට ප්‍රිය වූ ප්‍රියදසි රජු දෙ ආකාරයක චිකිත්සා ශාලාවන් කරවී ය. ඒ දෙයාකාර ප්‍රතිකාර ක්‍රමය නම් මනුස්සයන්ට හා තිරිසනුන්ට ප්‍රතිකාර දෙක ය යනු යි.

ආකාර කීපයක සම්භවයෙන් සහ දේශීය අනන්‍යතාව ඇති වෛද්‍ය ක්‍රමයක් මෙහි බොහෝ කල් සිට පැවැත එන්නේ යැයි සැලකිය හැකි ය. සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක මේ සඳහා බහුලව තිබේ. ලංකාවේ පැරණි වෛද්‍ය ක්‍රමය පිළිබඳව බොහෝ තොරතුරු ග්‍රන්ථාරූඪව ඇති පුස්කොළ පොත් අනුව ඒ බව සිතාගත හැකි ය. ඇතැම් පුස්කොළ පිටපත් අභාවයට ගොස් ඇති බව ද ප්‍රකට ය. වෛද්‍ය පුස්කොළ පිටපත් ගණනාවක් මුද්‍රණයෙන් අනුලේඛනය වී තිබීම වැදගත් කරුණකි. පිටපත් නොවූ සහ පර්යේෂණයට ලක් නොවූ ඒවා පිළිබඳව කටයුතු කිරීමට අවැසියාව ඇතොත් තව ද මූලික සම්පත් දිවයිනේ පවතින බව පැවසිය හැකි ය. අදාළ දේ සොයා බැලීම පර්යේෂණවල ස්වභාවය යි. පර්යේෂණය ද විවිධාකාර විය හැකි ය. ආයුර්වේද පර්යේෂණ ක්‍රමවිද්‍යාව යටතේ වෛද්‍ය ක්‍රම මෙන්ම ඒ හා බැඳුනු සාහිත්‍යය කෘති පිළිබඳව ද පර්යේෂණ පවත්වා තිබේ. තව දුරටත් පර්යේෂණ කළ හැකි ය. "පර්යේෂණ යනු සෙවීමයි. පරික්ෂා කිරීම, නිගමනවලට එළඹීම, විග්‍රහ කිරීම, විවේචනය කිරීම, තර්ක කිරීම, අනුමත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, තහවුරු කිරීම ආදී

ක්‍රියාවන් රැසක් පර්යේෂණයකදී සිදුවේ."[6]

ආයුර්වේද පර්යේෂණ විධි අටක් මෙසේ ය. මූලධර්ම පර්යේෂණ (Fundamental Research), සායනික පර්යේෂණ (Clinical Research), ඖෂධ පර්යේෂණ (Daug Research), පෝෂණවේද පර්යේෂණ (Nutritional Research), ඖෂධ නිෂ්පාදන පර්යේෂණ (pharmaeental Research). නිරීක්ෂණ පර්යේෂණ (Experimental Research), සාහිත්‍ය පර්යේෂණ (Literaly Research). සෞඛ්‍ය හා ස්වස්ථතාව (Heaiuilth Research) යනුයි."ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළ වැදගත් ග්‍රන්ථයක් හෝ ග්‍රන්ථයක කොටසක් තෝරාගෙන ඒ පිළිබඳව අධ්‍යයනයක් සිදු කළ හැකි ය. මෙහි දී එම කෘතියෙන් දැක්වෙන අදහස් පුළුල් ලෙස විවරණය කිරීමෙන් නව ප්‍රවේශයක් පාඨකයාට ලබාදීමත් අදහස් කරනු ලැබේ."[7]

ඒ අනුව යමින්, මෙහි දී අපට හමු වූ මහාසම්මත ගර්භවිධිය නම් පුස්කොළ පොතට අයත් තොරතුරු ආශ්‍රයෙන් ඉහත මාතෘකාව යටතේ තොරතුරු බිඳක් මෙයින් එළි දක්වනු ලැබෙයි. මේ පිටපතෙහි ගද්‍ය සහ පද්‍ය යන දෙ ආකාරයෙන් ම කරුණු ඇතුළත් ය. ලේඛනයේ යම් යම් විසමතා දක්නා ලැබේ. විශේෂයෙන් ම අක්ෂර භාවිතය තුළ ය. 'ගර්භිණීන්' යන්න 'ගබ්බීයින්ඩ' ලෙස යෙදී ඇත. 'වින්නමූ' යන්න 'විල්ලමූ' ලෙස සඳහන්ව තිබේ. 'ර්' කාරය සඳහා 'ශ් ' ලක්ෂණය යෙදී ඇත. දැකුම්කලු අකුරු නොවේ. එකම අයකුගේ අත් අකුරු බව අනුමාන කළහැකි ය.

ආරම්භක පත් ඉරුව 'ස්වස්ති සිදධම්' යනුවෙන් පටන් ගැනේ. පොත අවසන් නැත. මෙහි එක් පත් ඉරුවක 'යෝගරත්නාගරේ' ගබ්බී විධිය නිමී යන්න සඳහන්ව තිබිණ. තවත් පත් ඉරුවක 'ඉතිවරයෝගරත්නාගරේ' යනුවෙන් ද සඳහන් වෙයි. යෝගරත්නාකරය සම්බන්ධයෙන් මහාචාර්ය පුංචිබණ්ඩාර සන්නස්ගල ශූරිහු මෙසේ සඳහන් කරති. යෝගරත්නාකරය (ක්‍රි. ව. 1288) කෝට්ටේ කාලයේ කෘතියකැයි බොහෝ දෙනාගේ අදහසයි. යෝගරත්නාකරය මෙතෙක් අපට හමු වූ විශාලම සිංහල වෙද පොත බව කිව හැකි යි. එසේ ම එය

පළමුවන සිංහල මහ වෙද පොතයි. එහි ප්‍රමාණය විවිධ වෘත්ත අනුව කළ කවි 4557කි. යෝග නම් ඖෂධ හෙවත් බෙහෙත් සංයෝගයයි. ඒ යෝග නැමැති රත්නයන්ට ආකරය යන අර්ථයෙන් මේ පොතට යෝගරත්නාකරයි නම් දී ඇත. යෝගරත්නාකරය සකු වෙදපොතක සිංහල පරිවර්තනයකි. ඒ බව පොතේ මුල සඳහන් වෙයි.

සව්සතන් වෙත  මෙ  ත්
සිතින් කුළුණෙන් බලව  ත්
ඉසිවර හු  නැණව  ත්
ආයුවෙදය මෙසේ පවස  ත්

ඒ සතරින් නොම  ද
කිසි පොත් බලා පිරිසි  ද
රැගෙන ඔසු මනන  ද
කියමි සිංහල බසින් පද බැ  ද

පෙර ඉසිවරුන්ගේ ආයුර්වේදයෙහි වූ "කිසි පොත් බලා" සිංහල කවියට නගමින් කළ බව ඉන් කියැවෙයි. මෙහි සඳහන් **යෝගරත්නාකරයට** මුල් වූ පොත මේයයි මෙහි නො දැක්වේ. එහෙත් පොතේ සෑම ආධ්‍යායකම අවසන **"ඉතිවරයෝගරත්නාකරෙ"** යනුවෙන් මුල් පොත 'වරයෝගරත්නාකරය' නමින් හඳුන්වා තිබේ. ශ්‍රී **යෝගරත්නාකර** නමින් සකු වෙද පොතක් ඇත ද ඊට මෙහි සම්බන්ධයක් නැත. වරයෝගරත්නාකරය මෙසේ හෙළ කවියට නැගූ පඬිවරයා හරිහැටි හඳුනාගත නොහැකියි. ඇතැම් පිටපත්වල පමණක් කතුවරයාගේ නම මෙසේ දැක්වේ.

මෙහි සඳහන් පරිදි යෝගරත්නාකරය කරන ලද්දේ **මොනරගම්මන** නමින් ප්‍රසිද්ධව සිටි හිමි නමක විසිනි. මේ හිමිතුමා දඹදෙණි කාලීන කෙනෙකු බව මෙරට ඇතැම් වෙදවරුන්ගේ අදහසයි.

බුවනෙකබා නම් රජ කෙනෙකුගේ සොළොස්වන අවුරුද්දෙහි මේ පොත කළ බව මුල් කවිවල සඳහන්ව තිබේ. කෝට්ටේ රාජ්‍යයෙහි අවසාන විසූ බුවනෙකබා ඩසස (ක්‍රි. ව. 1529-1550) මේ රජු කොට

තැකූ අය මේ පොත කෝට්ටේ කාලීන කෘතියක් සේ ගෙන තිබේ. පැරණි වෙදවරුන්ගේ ආදීනව අනුව මොනරගම්මන තෙරිඳු දඹදෙණි කාලයේ විසූ බව පිළිගැනීමේ දී යෝගරත්නාකරය යාපහු බුවනෙකබා (ක්‍රි. ව. 1272) ගේ සොළොස්වන වියෙන් (ක්‍රි. ව. 1288) බිහිව ආ බව සැලකිය හැකියි. වරයෝගරත්නාකරය ද මේ හිමියන්ගේ ම අනිත් කෘතියක් කොට සලකනු ලැබේ. භාෂාව ඉගෙනගත හැකි කවි පොතකට වඩා වෙදකම ඉගෙනගන්නා පොතක් හැටියට යෝගරත්නාකරය ලක්වැසියනට පිහිටවූවකි. පැරණි සිංහල වෛද්‍යවරයන් සෑම කෙනෙකු පාහේම මේ පොත භාවිත කොට ඇත.[8] යෝගරත්නාකරයේ පුස්කොළ පිටපත් තුනක් බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත්ව ඇත. එම වෙදපොතේ කර්තෘත්වය මොදරාගම් මහ තෙරුන්ට හිමිවෙයි.[9] හියු නෙවිල් එකතුවේ (බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ) යෝගරත්නාකර පිටපත් දෙකක් ඇත. ඉන් එකක් පත් ඉරු 221කින් ද අනෙක පත් ඉරු 457 කින් ද යුක්ත වෙයි. එකී පිටපත් සිංහල පද්‍යයෙන් යුක්තය.[10] ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් යෝගරත්නාකරය නැවත මුද්‍රණය කරවා තිබේ. දේශිය වෛද්‍ය ශාස්ත්‍රයේ ස්වර්ණමය යුගය අනුරාධපුර යුගය බව වංශකතානුගත සාධක සහ පුරාවිද්‍යාත්මක සාධක කෙරෙන් පැහැදිලි වනු ඇත. බුද්ධදාස රජුගේ විස්මිත වෙදකම් පිළිබඳ පුවත් මහාවංශයේ මනහරව ගලපා තිබේ. බුද්ධදාස රජතුමා විසින් ලියනු ලැබූ සරාර්ථසංග්‍රහය කෘතිය සඳහා ඊට පෙර වූ කෘති රැසක් පාදක කැරගෙන ඇතැයි විශ්වාස කැරේ. එමෙන් ම ලංකාවේ දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ ඇති අගනා ග්‍රන්ථයක් වන භෛසජ්ජ මංජුසාව සඳහා පාදක කැරගෙන ඇති කෘති ප්‍රමාණය හැටක් වේ. ඒ විස්තර අනුව ලංකාවේ දේශීය වෙදපොත් කෙතරම් ප්‍රමාණයක් ලියැවී ඇත්දැයි තවම නිශ්චිතව ගණන්කැර නැත. ප්‍රකට මෙන්ම අප්‍රකට කෘති බහුලව තිබේ. ඒවා දේශීය හා විදේශීය වශයෙන් දෙයාකාරවනු ඇත. එමෙන් ම පුද්ගලික සහ ආයතන එකතු වශයෙන් ඒවා තැම්පත්ව තිබේ. ආයතන මට්ටමේ කෘති භාවිත වීමත් ආරක්ෂාකාරීව පැවතීමත් දක්නා ලැබේ. පුද්ගල මට්ටමේ ඇතැම් ඒවා භාවිත හා අභාවිත යන දෙයාකාරයෙන් ම පවතින අයුරු මේ ක්ෂේත්‍රය කෙරෙන් පැහැදිලි විය. අභාවයට යන දේශීය වෙද පොත් ආරක්ෂාකර ගැනීම වහ වහා කළ යුතුව පවතී. සංරක්ෂණය කිරීම මෙන් ම නවීන විද්‍යානකූලව පිටපත් කරණය ද

මේ වෙනුවෙන් සිදුකළ හැකි ය. ඉදිරියේ දී විස්තර කිරීමට අපේක්ෂිත අපට ලැබී ඇති පුස්කොළ පොත යෝගරත්නාකරයේ කොටසක් පමණක් ම නොවන බව හැඟීයයි. එහි ගද්‍ය පද්‍ය දෙයාකාරයෙන් ම විස්තර වන හෙයින් එකී වෙද පරපුරේ අත්පොතක් බව එහි සඳහන් කැර තිබේ. අපගේ විශ්වාසයට අනුව එකී අත්පොතට පාරම්පරික දේශීය වෙදකමේ විධික්‍රම කිසියම් ප්‍රමාණයක් එකතුව ඇත. මහාසම්මත ගර්භ විධිය යනුවෙන් තව ද තිබේදැයි විමසිය යුතු ය. චරක සංහිතාවේ ගර්භිණී චිකිත්සා සඳහන් වනුයේ බුද්ධිකා ගර්භාවක්‍රාන්ති ශරීරය මහාගර්භාවක්‍රාන්ති ශරීරය වශයෙනි.[11]

සාරාර්ථ සංග්‍රහයේ දැක්වෙනුයේ ගර්භිණී චිකිත්සා වශයෙනි.[12] වරයෝගසංග්‍රහයෙහි විශේෂ කොටසක් නැතත් ගර්භිණීන්ගේ රෝග ාබාධ රැසකට පිළියම් සඳහන්ව ඇත.[13] මෙය සාර සංඛේපයෙහි ගර්භිණී චිකිත්සා යනුවෙන් දැක්වෙයි.[14] ශ්‍රී යෝගරත්නාකරය කෘතියේ ගර්භිණී ප්‍රතිසන්ධි චිකිත්සා යනුවෙන් පරිච්ඡේදයක් අන්තර්ගත වෙයි. [15] යෝගරත්නාකරයේ ගර්භිණී චිකිත්සා සහ ස්ත්‍රී චිකිත්සා ලෙස පරිච්ඡේද දෙකක් බව පැනේ.[16] දේශීය වෛද්‍ය ක්‍රමයේ අගනා කෘතියක් වූ භෙසජ්ජ මංජුසාවේ ගර්භිණී චිකිත්සා ක්‍රමයක් ගැන සඳහන් නොවේ.[17] "භෙසජ්ජමංජුසාව උපන්‍යාස විධි පද්ධතියේ පටන්කොට සැට වැදෑරුම් වූ පද්ධති සංඛ්‍යාවකින් යුක්ත වන්නේ ය. එහෙත් ස්ත්‍රී චිකිත්සාව හෝ කුමාර ව්‍යාය චිකිත්සාව ගැන පද්ධතීන් ලියා නොමැතියි. එසේ වනුයේ මේ වෛද්‍ය ප්‍රකරණය වෙසෙසින්ම භික්ෂු සංඝයා වහන්සේගේ ආයුරාරෝග්‍ය ලාභය සඳහා ලියැවුණු හෙයිනැයි කිව හැකිය."[18]

අපට ලැබුණු ඉහත සඳහන් බෝගහවැව අත්වෙද පොතේ කීප තැනකම ඉතිවරයෝගරත්නාගරේ යන්න සඳහන්ව තිබිණ. ඒ අනුව මෙය වරයෝගරත්නාකරය හෙවත් යෝගරත්නාකරයෙන් පිටපත් කරනු ලැබූ කොටස් බව පැනේ. ශ්‍රී ලංකා රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් 1997 වසර දී සිංහල යෝගරත්නාකරය නමින් කෘතියක් පළකැර ඇත. මෙය සැකසීම සඳහා ම විසින් එකී සංස්කරණයේ 1997 පිටපත පරිශීලනය කරන ලදී. එහි පද්‍ය 4561ක් ඇතුළත් බව පෙන්නුම් කැරේ. ඒ අතර එහි පිටු අංක 65

- 70 අතර ගර්භිණී චිකිත්සා යටතේ පද්‍ය 40ක් සඳහන්වෙයි. දරු ප්‍රසූතියට, බඩ මළ දරුවන් වැටෙන්ඩ, වැදෑමස වැටෙන්ට, වැදූලියට බොජුන්, කඳරදේට, කිරි පිරිසිදුවීමට යන කාරණා වෙනුවෙන් එක එක පද්‍ය ප්‍රමාණ තුළින් ප්‍රතිකාර විධික්‍රම යන ඖෂධ මෙන්ම බෙහෙත් සාදාගන්නා ආකාරය ගැනද විස්තර වෙයි. එම කෘතියෙහිම පිටු අංක 480 - 510 පිටු අතර ස්ත්‍රී රෝග චිකිත්සා, යටතේ පද්‍ය 185ක් තුළ දරුගැබ් විනාශවීම, දරුවන් නැති අයට, කන්‍යාභාවය ඇතිවීමට, ලේමාලයට, ක්‍රිමිදෝසයට, යෝනිදෝසයට, තන රුදාවට, කිරි එරෙන්ඩ, බඩ මළදරු ලකුණු, කඳගැට රුජාවට යක්ෂ අම්යාවට ඖෂධ ප්‍රතිකාර හා වෙනත් විස්තර සඳහන් වෙයි.

බුද්ධදාස මහ රජතුමන්ගේ වෛද්‍යක සාරාර්ථ සංග්‍රහයෙහි සතරවැනි අධ්‍යායයෙහි ගර්භිණී චිකිත්සා අන්තර්ගත වේ. එය ලිංගභේදය, කැමති දරුවකු ලබාගැනීම, ගර්භකාරක ඖෂධ වර්ග, ගර්භාරක්ෂක ඖෂධ වර්ග, උණට, ශෝථයට, වමනයට, මහලෙයට, ගර්භ ශූලයට, මාසානුමායික කාර්ය ක්‍රමය, සූතිකා චික්ත්සා, මළකුණු වැටෙන්ඩ, යෝනි දෝෂයට, වැදෑමස වැටෙන්ට රුජාවට, මැටිගුලිය, ගර්භ ශාන්ති රසය යන මාතෘකා යටතේ ඖෂධ, ප්‍රතිකාර සහ ක්‍රමවේද සඳහන් වෙයි. කිරි පිරිසිදු වීමට, රක්ත ගුල්මයට, නිලක්ෂාර ඝෘතය වශයෙනි.

වරයෝගසංග්‍රහයෙහි, ප්‍රසූතියට දරු බිහි නොවී සිටින විට, කුසේ මළදරුවන් බිහිවීමට, කුසේ දරුවා මළ බවට ලකුණු, වැදෑමස වැටෙන්ඩ, ප්‍රසූතියෙන් පසු මළ ශුද්ධ වීමට, කිළිකුනු අඩිස්සියට, ප්‍රසූතිකාවන්ගේ අක්කාරම්වලට, කඳගැට රුජාවට, ප්‍රසූතිකාවනගේ වාත අජීර්ණ මන්දාගිනි රෝග, ප්‍රසූතිකාවන්ගේ බඩේ රුජාවට, කොන්දේ රුජාව, ප්‍රසූතිකාවන්ගේ ජ්වරයට, ප්‍රසූතිකාවන්ගේ කැස්සට, ප්‍රසූතිකාවන්ගේ මාලේ යනවාට සහ සාරේයනවාට, සන්නියට, බඩවැල ගැටගැහීමට, කට කෙළ වියලීමට, වමනයට, බඩයාමට, සන්නි විකාරවලට, ප්‍රසූතිකාවන්ගේ අතපය වලංගුනැතුවාට, බඩේ ඇවිල්ලට, යක්‍ෂ විකාරෙට, අතීසාරයට, ග්‍රහණියට, හික්කාවට, ගැබිණියන්ගේ බඩ ඉදිමුවට, බඩ පිපුමට, ගර්භ ශ්‍රාවයට, ගැබිණියන්ගේ සියලු අමාරුවලට, ගැබිණියන්ට ඒ ඒ මාසවලට දෙන බේත් ආදිය ගැන ද ඖෂධ ප්‍රතිකාර

සහ බෙහෙත් සාදාගන්නා ආකාර පිළිබඳව විස්තර අන්තර්ගත වෙයි.

ඉහත කෘති සියල්ලටම වඩා වැඩි වශයෙන් බෝගහවැව මහාසම්මත ගර්භවිධියේ තොරතුරු බහුල ය. ප්‍රධාන කාරණා 145ක් යටතේ විස්තර සංවිධානය කැර ඇති එකී පිටපතේ පුනරුක්ති කීප තැනක ම සඳහන්ව තිබිණ. ඇතැම් මාතෘකා පුනරුක්ති වශයෙන් තිබුණ ද බෙහෙත් ප්‍රතිකාර සහ ඖෂධ වර්ග එකිනෙකට වෙනස් ය. එම මාතෘකා පුස්කොළ පොතේ පත් ඉරුවල දෙපැත්තෙන්ම වම්පැත්තේ කුඩා අකුරින් ලියා තිබිණ. ඒවා මෙසේ ය.

ගැබ ස්ථාවර වීමට බේත් හා ලිංග භේදය. ගර්භයට උෂ්ණ නොවදිනා කාරණාව. වැදුන් පරක්කුවට බේත්. මළදරුවෝ වැටෙන්ඩ. වැදෑමහ වැටෙන්ඩ. ගර්භිණීන්ට කසාය. ගර්භයට වමනයට කසාය. ගර්භිණීන්ගේ අතීසාරයට. වදන්ඩ බැරුවාට. ගර්භ රුදාව වාරුනැතුවාට. ගර්භිණීන්ගේ ඉදිමුනට. කැරකැවිල්ලට. ගර්භිණීන්ගේ වමනේට. ඔක්කාරෙට. ගර්භිණීන්ගේ කොන්දේ බඩේ කැක්කුමට. ගර්භ කසාය. ගර්භිණීන්ගේ කරකැවිල්ලට. ගර්භිණීන්ගේ ඇවිලිල්ලට - ගර්භ රුජාවට උණ අතීසාරෙට. ගර්භිණීන්ගේ බඩිංයනවාට. ගර්භිණීන්ඩ රස මී බස්න. ගර්භ ඉදිමුනට. ගර්භියින්ඩ චූර්ණෙ. ගර්භ ළමයා නොපෙරලෙනවාට. ගර්භ වමනෙට. ගර්භ මාලේට. ගර්භ රුජාවට වමනෙට ගර්භිණීන්ගේ ලැයවේලී දිව ලුහුඬුවට. ගර්භ විපරීතේ ලකුණු - ගර්භ ඇවිලිල්ලට. ගර්භිණීන්ගේ ලේවැගිරෙනවාට. ගර්භිණීන්ගේ ඉකිලි කැක්කුමට. ගර්භිණීන්ඩ දොඩම්කායම. කුණුවැටෙන්ඩ, රුදාව ඒරුනැතුවාට. ගර්භිණීන්ඩ කල්කෙ වදන්ඩ බැරුවාට. ගර්භිණීන්ගේ කට්ටමුට්ටුවට. ගර්භිණීන්ගේ අත්කකුල් වාරුනැතුවාට කැකිරිගෙඩිගේ බස්නේ. ගර්භිණීන්ගේ ඇවිලිල්ලට. ගර්භ වමනේට. ගර්භ බඩ දායට මුත්‍රා අඩිස්සියට. ගර්භ ඉදිමුනට, ගර්භිණීන්ඩ චූර්ණෙ. ගර්භිණීන්ගේ බඩිංයාවට චූර්ණෙ. ගර්භිණීන්ගේ බඩිංයනවාට. වදන්ට බැරුවාට මන්තරේ. වදන්ඩ කොටන බේත්. ගර්භ කුසතුළ කැක්කුමට එව මාලේට. ගර්භ මාලේට. ගර්භිණීන්ඩ නැටිකසාය. කන්දකුමාර අග්නි කසාය. ගර්භ සුද්ද තෛලේ. ගර්භ මූල තෛලේ. නිල්වැල් කසාය. ගර්භ විපුල නවරත්න චූර්ණෙ. ගර්භ කුඩ. සන්වාස විදිය. ගර්භ සාන්ති සංග්‍රහ. ගර්භ සංග්‍රහචිකිත්සා. ගර්භිණීන්ඩ රාජගුරු බස්නේ. ගර්භිණීන්ඩ

බස්නෙ. ගර්භිණීන්ගේ කැස්සට. කුස පිළිකා විදිය. කුස පිළිකාවට කායම. කුස පිළිකාවට වීරපත්‍රාකායම. කුස පිළිකාවට මහකායම. වැදූගේ කිලිකුණු අඩිස්සියට සන්නි පිළිකාවට කායන්. වැදූගේ ඉලප්පුවට රට අමු මිරිස් ගන්නා කසාය. වැදූගේ සන්නියට තැම්බුම. දිව්‍යාංගනා තෛයිලය. වැදූගෙ සහ නිකං අයගේ මාලේට. බඩවැල පාත් උනාට. නොහිටිනා මාලේ යනවාට තලපේ. වැදූගෙට වදකහ කායම. වැදූගෙට රඹුක්බොඩ කායම. වැදූගෙ කරප්පමට. අංජනම ඊට තෛලෙ. වැදූගේ බඩේ කැක්කුමට. වැදූගෙට නාරායන බස්නෙ. වැදූගෙට කපු ඇට කායම. මහානාරායන බස්නෙ. තිස්වග තැම්බුම. වැදූ අයගේ කොරේට. වැදූගෙ ඇනුමට. වැදුගෙ ජයපාල මාත්තු මැකෙන්ඩ. වැදූගෙට සිරිදෙවි කසාය. වැදූගෙ ලේවමනෙට. වැදූගෙ කකුල දිග යන රුදාවට කසාය. එම කායම. වැදූගෙ සන්නියට තැම්බුම. පොල් ගෙඩියෙ බස්නේ. වැදූගෙ සන්නියට තැම්බුම. වැදූගෙට නස්නෙ. වැදූගේ මාලේට. වැදුගේ රුජාවට. වැදූගෙ කිලි අඩිස්සියට. වැදූගෙ ගිනියමට, කැස්සට, ඉකිලිකැක්කුමට, ඇනුමට. වැදූගෙ ලපැත්තේ අඩිස්සියට බස්නේ. වැදූගෙට ගුලිය. වැදූගෙ කොන්දෙන් පුරා උකුණුවල යන රුදාවට. වැදූගෙ නෙතේරෙන සන්නියට. වැදූගෙට බස්නේ. ඉකිලි කැක්කුමට. කිලි අඩිස්සියට. වැදූගෙට සන්නි විදුර. වැදූගෙ කිලිකුනු අඩිස්සියට, බඩේ රුජාවට. වැඳුගෙ ගුල්ම අඩිස්සියට කොල්ලු කසාය. වැදූගෙට මාලු කසාය. වැදූගෙ උනට ඇවිලිල්ලට. වැදුගෙ අඩිස්සි තැනට ගුලිය. මාලේ අඩිස්සියට වැදූගෙට ගුලිය. කසපැන් බස්නේ. වැදූගෙ ලෙඩට කපාල කල්කෙ. කනවක්කරන බේත්. වැදූගෙට දිය පිපාසෙට නස්නෙ. වැදූගෙට දුම. වැදූගෙට කෙංඩා පෙරලෙනවාට නස්නේ. වැදූගෙ කෝල සන්නියට බස්නේ. මහා හෙනරාජ කායම. බල හෙනරාජ කසාය. චන්ද්‍රපත් කායම. ජීවක මහරත ගුලියග කුණ වැටෙන්ඩ. බඩේ කැක්කුමට. නොබසිනා උන විකාරෙට. සෙන් පිත් කෝලෙට. වැදූගෙ ඉලප්පුවට. වැදූගෙ කෝල කැස්සට. වැදූගෙ ගුල්ම කැක්කුමට. වැදූගෙ කිලි මාලේට. වැදූගෙ වෙවුලන් සන්නියට. වැදූගෙට තෙල් බස්නේ. වැදූගෙ බඩේ අල්ලනවාට කායම. වැදූගෙ කහල වේලිල්ලට හෙනරාජ කායම. අනුමුට්ටුවට තැම්බුම. වශයෙනි.

අදාළ පුස්කොළ පිටපතේ අන්තර්ගත නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**නමෝ බුද්ධාය.**
**මහාසම්මත ගර්භවිදිය කියනු ලැබේ.**

## ගැබබිය නොවන්ධ

ස්ත්‍රී කඩ කිලිටුව පිලි ළු සතර වෙනි දා නුග ඇසටු අරළු හරියට ගෙන සිනිඳුව අඹරා එළකිරි තුන් කලඳක් ගෙන ඇඹරූ බේතේ දිය කොට කකාරා තුන් දවසක් දෙනු ගර්භයා සම්පූර්ණ වෙයි. හටගත් ගැබ දකුණ බරවී නම් පුරුෂ ලක්ෂණයයි. වම බරවී නම් ස්ත්‍රී ලක්ෂණයයි. ඔරුව සේ බඩ මැද උස්ව තිබුණි නම් නපුංසක ලක්ෂණයයි.

## ගර්භයාට ඌෂ්ණ නොවදින කාරණාව කෙසේද?

පිතෙන් වසා තිබෙන්නේ ය. ඒ ගාවා අග්නිය ය. ඉන්පසු ලෙල්වායු මැද්දේ දියවරයි. ඉන් පත්ලේ ගර්භයා උපන්නේ ය. මේ කාරණාවෙන් ගර්භයාට ඌෂ්ණ නොවදින්නේ ය. ගර්භයේ ඉඳන් බිලිඳු නාඩනා කාරණාව නම් වැදෑමසින් මුන වැසී උගුර වැසී සෙලෙස්මායෙන් පිරී හිපස්සාවකින් වසා තිබෙන්නේ නිසා අඬන්ඩ බැරිවෙන්නේ ය. ගර්භයා උපන් මාසේදි දියවර තිබෙයි දෙවෙනි මාසෙදි දැඩිවන්නේ ය. තුන්වෙනි මාසේදි මස් වන්නේ ය. සතරවෙනි මාසෙදි ඇට වන්නේ ය. පස්වෙනි මාසයේදි නහර හටගන්නේ ය. සයවෙනි මාසයේදි ලේ හටගන්නේය. සත්වෙනි මාසේදි සිහි ඇතිවන්නෙ ය. අටවෙනි මාසෙන් බඩගිනි වන්නේ ය. නවවෙනි මාසෙන් හෙල විලි වන්නේ ය. දහවෙනි මාසෙන් වැදුම ඇති වන්නේ ය.

## වැදුන් පරක්කුවට බේත්

අඩාතෝඩ මුල් ඉඟි මුල් පාවට්ටා මුල් කොළ ඉද්දදළු දියමිත්තමුල් මේකීවා එක එක ඇල්දියෙන් අඹරා යටිපල්ලේ හෝ පෙකණියේ ගානු වදත්. මීට ම කරල්සැබෝ ඇට දියකර යටිපල්ලේ ගානු වදත් හා මිනී ඉස්කබල් දෙහි ඇඹුලෙන් ගල ගා යටිපල්ලේ ගානු වදත් හා හබරල අල ඇල් දියෙන් අඹරා පොවනු වදත් කැලියා පොතු නානු අනා

පොවනු වදත්. කහලේන් මාලු දෙහි ඇඹුලෙන් ගල ගා පොවනු වදත්. ගර්භයා ඉස්නැග සිටින වේලාවට ගොඩමානෙල් අල යෝනියෙන් පාත තබනු විගසින් වදත්. හා මීටම **"ඕං නමෝ යෙල ගුරුවානේස්වඃ"** මෙම මන්ත්‍රයෙන් වතුර මතුරා පොවනු වදත් හා ඉස්ගුන හැරෙයි.

නියඟලා අල, සහිඳලුනු, මීයෙන් ගල ගා නාබියේ ඉස්මුදුනේ යටිපතුලේ ගානු එවලෙම වදත් හා වැදූ කල නොපමාව සෝදනු නැගෙනහිරට ගිය පුහුල් මුල උදුරා ඉසබඳිනු වදත් හා උතුරට ගිය එඬරු මුල උදුරා තුන්පොට මුදු හිරුව තනා විල්ලඹු අයගේ ඇඟිල්ලට දමා දෝත පානු වදත් හා බෙලි පිංචි ඇල් දියෙන් අඹරා පොවනු වදත්.

## මළදරුවො වැටෙන්ඩ

උළුවාහාල් අඹරා තලතෙලෙන් පොවනු මළදරුවො වැටෙයි. මල්තුඹ අල මීතෙලින් බැද කවනු. බඩේ මළ දරුවා වැටෙයි.

## වැදෑමහ වැටෙන්ඩ

කපු කොළ මුල් කොටා කකාරා පොවනු හා ඔලිඳකොළ ඉස්ම යෝනියේ ගා විල්ලඹු අයගේ අතේ ගා විලි පහරනු වැදැමහ වැටෙයි. කඳගැට රුජාවට, අබ ඇට කාඩි දියෙන් අඹරා පොවනු. තිප්පිලි කුඩු රාජනක් එක්ක පොවනු කඳගැට රුජා නිවීය යි.

## ගර්භිණීන්ට කසායට

වැල්කසඹිලියා, බැබිල මුල්, ඉගුරු, වම්මුතු කොත්තමල්ලි මෙ කීවා කොටා කකාරා දෙනු ගර්භයින්ගේ බඩින් යනවාට, ඉදිමුනට යහපොති. මීටම උණට බෝධි ඇට, කොත්තමල්ලි, බැබිල මුල්, කිරිඅඟුන මුල්, කලාඳුරු අල මෙ කීවා කොටා හතර එකට කකාරා දෙනු ගර්භයින්ගේ උණ නිවීයයි. මීටම සාරණ මුල්, අමු ඉගුරු සය කලඳක් ගෙන කොටා එළකිරි සමඟ කකාරා දෙනු ගර්භයිනගේ ඉදිමුං අර්සස් ගුණවෙයි.

## ගර්භයාට වමනයට කසාය

සවැන්දරා මුල්, ඉරිවේරිය මුල් මෙකීවා කලඳ කලඳ ගෙන කොටා විලඳ පතක් දමා කකාරා දෙනු. වමනේ ගුණවෙයි. මීටම බෙලිමුල්, බැබිල මුල් මෙකීවා දොලොස් කලඳක් ගෙන කොටා එළකිරි සමඟ එකට කකාරා දෙනු. ගර්භයින්ගේ උණ වමනේ ගුණ වෙයි. මීටම කොත්තමල්ලී තුන් කලදක් අඹරා සාල්පානු දියට සෝදා කකාරා සීනි සමඟ පානය කරනු. මීටම කිරිබදු අල, ඉරමුසු මුල්, දියමිත්ත මුල්, ඉරිවේරිය, කලාඳුරු අල, ඉඟුරු දෙ කලඳ දෙ කලඳ ගෙන කොටා දිය එකට කකාරා පානය කරනු. ගර්භයින්ගේ ජවරය ගුණවෙයි. මීටම ඇත් දෙඹට මුල්, රසකිඳ මෙකීවා එක පමණට ගෙන කකාරා සීනි සමඟ දෙනු. ගර්භයින්ගේ ජ්වරය ගුණ වෙයි. මීටම වැල්මී, කිරිබදු අල, ඉරමුසු මුල්, නෙලුං අල මේ හැම කලඳ කලඳ ගෙන කොටා දිය එකට කකාරා දෙනු ගර්භයින්ගේ ජ්වරය ගුණ වෙයි.

## ගර්භණීන්ගේ අතීසාරයට

ගර්භයින්ගේ අතීසාරයට වැල්කහඹිලියා මුල්, බැබිල, දියමිත්ත මුල්, අමු ඉඟුරු, කලාඳුරු අල මේවා මංචාඩි සතර සතර ගෙන කොටා දිය එකට සිඳුවා පෙරා මීට තිප්පිලි රත්නිතුල් මුල්, වදකහ, අමු ඉඟුරු, එනසල් අතිඋඩයන් සිවිය මුල්, මළමිරිස්, මෝදගං, සිරිතේක්කු, මුරුවා මුල්, තොටිල්ල පොතු, අබ පෙරුංකායන්, කටුකරෝසන වගපුල් කලඳ කලඳ ගෙන අඹරා තල තෙලෙන් එක්කර පස්වරුවක් කකාරා පානයකර පිටගා තවනු. මින්ගුන ගර්භිණීන්ගේ යෝනිරුජා යෝනින් පිටත නික්මුණ රුජා අඩක් ගුණවෙයි. වමනේට අසමෝදගං, අමුක්කරා මුල්, සුදුදුරු, තිප්පිලි මෙවා චූර්ණකර සීනියෙන් මී පැණියෙන් දෙනු ගර්භයින්ගේ වමනේ ගුණවෙයි.

## වදන්ඩ බැරුවාට හා මළදරු වැටෙන්ඩ

ඇ පොතු, ඉත්තෑ කුරු, කංඹිලි පුලුස්සා අලුගෙන සීනක්කාරං, පල්මානික්කං පුස්කර පෙරුංකායන් මේවා කුඩුකර එඬරු තෙලට යොදා තෙල්සිඳ පොවනු. එවෙලේම වදත් හා අත්දුටුවයි. බඩ මළ

දරුවන් වැටෙයි. අන්නාසි ඇඹුල්, ගිනිතිල්ල කොළ, සත්සඳකොළ කොස් කොළ, රඹුක් බොඩ මේවා කොටා ඉස්ම ගෙන සීනක්කාරං පල්මානික්කං පුස්කර දෙදූරු මෝද, තිප්පිලි, සුදුලූනු, මෙවා අඹරා යොදා පොවනු. එවේලේම වදත් හා බඩ මළ දරුවෝ වැටෙයි. අත්දුටුවයි.

## ගර්භරුදාව වාරුනැතුවාට

ගර්භයින්ගේ කන්ඩක්කු සන්නියේ ගුණ නං, උනගනී රුදාවෙයි. බෙල්ලේ නහර ගැසෙයි, ලපැත්ත ගැසෙයි, බස ගොනුවෙයි, දෙවේලේ පැති කකියයි. සුසම්ලයි මුත්‍රාදායක කරවයි, බඩ ගසානයෙයි දෙකං ඩක්කු සන්නියේ ගුණයි. රුදාව වාරු නැතුන්ට මීට සිරිතේක්කූ, බිං කොහොඹ, කටුකරෝසන, සින් අරත්තන, දේවදාර, වංබටු මුල් මෙකීවා අට එකට කකාරා දෙනු ගුණවෙයි. රුදාව වාරු නැතිවාට නෙලුං අල, දියමිත්ත මුල්, ගොඩමානෙල් අල, ඉඳි බොඩ, පනං පෙති, වැල්මී, ඉගිනි ඇට, සුදු හඳුං කෙලිඳ ඇට මේවා කොටා පානවතුරෙන් කසපැන් වතුරෙන් කකාරා සීනි ගිතෙල් මුසුව දෙනු හා දස මස රුදාව වාරුවෙයි. අත්දුටුවයි. ගර්භයින්ගේ කරකැවිල්ල ගුණවෙයි. ගර්භයින්ගේ රුජාවට, කැස්සට බැබිලමුල් සතර කලඳයි සුදුලූනු හතර කලඳයි. මේවා කොටා තුන එකට කකාරා දෙනු.

## ගර්භිණීන්ගේ ඉදිමුනට, කැරකැවිල්ලට

තිරස්සවාලුමුල් දෙ කලඳයි, සහිඳලුනු දෙ කලඳයි, කරුංකා පුවක් දෙ කලඳයි, අමු ඉඟුරු දෙ කලඳයි. සුදුලුනු දෙ කලඳයි, අරළු දෙ කලඳයි. මෙකි දේ අට එකට කකාරා දෙනු ගර්භයින්ගේ සියලු ලෙඩට යහපති. ළමයා හරහට වැටුනාට හරහට බිහි වෙන්ඩ ආනං ඊට කුකුරුමහං ඇට, එලබටු ඇට, වදකහ, ඉසකේ දැවූ අළු, මොණරපිල් දැවූ අළු, ලාකඩ දැවු අළු, මෙකී බේත් එක පමණ ගෙන එළකිරි පතයි තැඹිලි දිය පතයි. පළමු බේත් කලතා එකවිට මනාවක් පමණ බොන්ට දෙනු. හතරවරක් විරේක වෙයි. අතපය එකවිටම බිහි උනාවත් මළකුණවත් එවේලේම ඉහළට ඇදී එවේලේම වැටෙයි. පසු පිත් දෙකයි වරද නැති හැටියට වරද අරවා දෙනු නැත්තං නොදෙනු තුන් පැය ඇතුලත නොවැටුනොත් නසී.

## ගර්භ මූත්‍රා අඩස්සියට කැකිරි ගෙඩියේ බස්නය

ගර්භයින්ගේ මූත්‍රා අඩස්සියට පොල්පලාමුල් ඉගිනි ඇට බැබිලමුල් රණවරාදළු ගල්මද ගල්නනර වැල්මී ගොකටු කිරෙන් අඹරා පැහිච්ච කැකිරි ගෙඩියකට අඩස්සිකර භාජනයකට දමා වතුර එක්කර ලිපේතියා තම්බා එම වතුරෙන්වත් අඹරා කසපැන් වතුරෙන්වත් එළකිරෙන්වත් දෙනු අඩස්සි ඇරෙයි. මූත්‍රා වැඩිවයානම් දෙ දූරු කරාඹු වසාවාසි සාදික්කා අබිං මෙකී දේ අඹරා කසපැන් තුන්දියෙන් දෙනු හිටී.

## ගර්භිණීන්ගේ වමනෙට ඔක්කාරේට වදන්ඩ බැරුවාට

වදකහ දෙහි ඇට බුරු ඇට තිඹිරි පෙරුංකායං මේවා දොඩං ඇඹුලෙන් අඹරා මී පැණි දොඩං ඇඹුල් සීනි හඳුන් අරලු ගලගා ගිතෙල් කොහොඹ තෙල් සමඟ දෙනු ගර්භයින්ගේ ගුල්ම වමනේ ගුණවෙයි. මීටම අඹදළු දඹදළු අමු ඉඟුරු මේවා එක හරියට ගෙන උනුවතුරෙන් අඹරා මී පැණියෙන් දෙනු වමනේ හිටී. වදන්ඩ බැරුවාට තෙලට ගිඟුරුපට යුෂ මනාවයි. පොල්කිරි නැලියයි කකාරා දෙ දූරු යවානි තිප්පිලි ත්‍රිජාති හිංගු ලසුනු අබිං උළුවා මෙකීදේ අඹරා තෙලට යොදා පදමට සිඳතබා පිටගානු බොන්ට දෙනු බිහිවෙයි සත්තයි යක්ෂ මායං ගුණ වෙයි. ඊටම සිරිතේක්කු කටුකරෝසන කර්කටක ශ්‍රීංගි වෙප්පල් අරිසි වැල්මී ත්‍රිපල් හිරියල් ඉඟුරු මිරිස් සුදුළුනු ගලිස් තිබ්බුටු කත්තිරික්කා වේලාමුල් බිම් මුල් දිම්බිජු මෙකී දේ කසාය කකාරා දෙනු වදත්. මීටම ඈ පොතු ඉත්තියාකුරු කම්බිලි පුලුස්සා අලුගෙන සීනක්කාරං පල්මානික්කං පුස්කර පෙරුකායං කුඩුකර එඬරු තෙල් පතක් ලිපේ තියා බේත් කුඩු දමා පැසවා දෙනු එවේලේම වදත් හා බඩ මළදරුවෝ වැටෙයි අත්දුටුවයි.

## ගර්භිණීන්ගේ බඩිං යනවාට චූර්ණෙ

අබිං කලඳයි දුම්මල දෙ කලඳයි දිවුල්ලාටු දෙ කලඳයි එකට අඹරා උනුදියෙන් දෙනු හිටී. ඊටම කරාඹු වසාවාසි සාදික්කා ලූනු අරණ පොතු අඹ ඇට මද අති උඩයන් දුම්මල දිවුල්ලාටු ඉඹුල්ලාට, මයිල කටුකරෝසන එල ඔලිඳ ඇට මෙකීදේ බැද උයාපුහාලේ බැද එකට

අඹරා බඩිං යනවාට කීලං මොරුවෙන් දෙනු. ලේ යනවාට සීනියෙන් දෙනු හිටී සත්තයි. මීටම දෙදුරු සාදික්කා බිංදුම්මල දිවුල්ලාටු මෙකී සරක්කු මුහ ඉස්මෙන් අඹරා එම ඉස්මෙන් පොවනු හිටී. මීටම රත්නිතුල් මුල් හීරස්ස මුල් කිඩාරන් මුල් සහිඳලුනු මෝදගං ඉඟුරු මිරිස් මෙකී සරක්කු බැද වල්බෙහෙත් වේලා එකට අඹරා මෝරුවෙන් දෙනු.

### ගර්භිණීන්ගේ බඩිං යනවාට

අජීර්ණයට බඩිටයනවාට යහපොති. මීට දෙදුරු මෝදගං තිප්පිලි ඉඟුරු මිරිස් වදකහ මෙකිවා ගෙන සුද්ද ජයපාල ඇට පතක් මුලකී සරක්කු එක්ක සියඹලා ඇඹුලෙන් අඹරා ගුලිකර සියඹලා ඇඹුලෙන් දෙනු හිටී. උනුදියෙන් දෙනු හිටී සත්තයි.

### වදන්ඩ බැරුවාට බේත් කියනු ලැබේ

වදන්ඩ බැරුවාට ද සමස ගිය තැන රුජාව පරක්කු වෙනවාට ද රුජාව නැති වෙනවාට ද අසීරු අමාරු වෙනවාටද මේ කියන දේට බඩේ ගාන්ඩ අවුසද කියනු ලැබේ. මීට පාවට්ටාමුල් කොළ ඉදිමුල් රසකිදමුල් දියමිත්තමුල් බෙහෙත් සියඹලා පලු ඉස්මෙන් අඹරා පෙකණියේ ගානු යටිපල්ලේ ගානු බිහිවෙයි. සෙරෙප්පාඩි මුල් අඹරා තලතෙලෙන් පොවනු බිහිවෙයි.

### වදන්ඩ බැරුවාට

අඟුනමුල් වැල්මී සැබෝමුල් ඇල්දියෙන් අඹරා යෝනියේ අතපය ගානු බිහිවෙයි. මීටම ඉඟුරු ඉර රාහු ඇල්ලුදා නියඟලා අලේ උදුරා තියා වදන්ඩ බැරිවිට ඇල්දියෙන් උරච්චි කොට යටිපල්ලේ ගානු වැදූ විට සෝදා දමනු. මීටම වංගෙඩිය දොරකඩ හිට දකුණට ගේ වටට පෙරලා දොරකඩ හිටුවා තෝරගහ උදුරා වනට ලා පොල් කට්ට වසා මෝලෙන් එකපාර පොල්බෑව පිපිරෙන්ඩ කොටනු වදත්.

## වදන්ඩ බැරිවාට මංතරේ

ඕන්නමො සිද්ධාර්ථ කුමාරයෝ උපන්වන දිනයෙහි මහිකාන්තාවෝ දෙස්කී හෙයින් කලුගල් රුසියා නොමළ හෙයින් ආසේ වැඩසිට පොළොවේ වැඩසිට බඩ රත්නයාගේ බිහිවෙන් පුතා බිහිවෙන්. මෙහි ක්‍රමයනම් එකසිය අටවරක් තෙල් මතුරා බොන්ට දෙනු. බිහිවෙයි. බඩේ ගානු වදත් පොල් ගෙඩියට එම ගනං මතුරා දොරකඩ තියා එකපාරට බිඳිනු බිහිවෙයි අත්දුටුවයි.

## වදන්ඩ කොටන බේත්

ඉරමුසුමුල් කතා නොකර පිටතිං උදුරා දොරකඩ හිට හත් පියවරක් මැන එතන වංගෙඩිය ගොඩනගා බේත දමා තුන්පාරක් කොටනු වදත් වැදෑමහ වැටෙයි. අත්දුටුවයි. වැල්මී ගිතෙලින් පොවනු බිහිවෙයි.

## වැදෑමහ වැටෙන්ඩ කඳගැට රුජාවට මළදරුවො වැටෙන්ඩ

මිනී ඉස්කබල් තල තෙලෙන් ගලගා යටිපල්ලේ ගානු බිහිවෙයි. හනිකට සෝදා දමනු. වැදෑමහ වැටෙන්ඩ ඔලිඳ මුල් කොටා මිරිකා පොවනු වැටෙයි. කඳට. අඹ පොත්ත කාඩියෙන් අඹරා පොවනු කඳ හිටී. කඳගැට රුජාවට තිප්පිලි, කිකිරිදිය, යුසගෙන පොවනු කඳගැට රුජා හිටී.

## මළදරුවෝ වැටෙන්ඩ

සීනක්කාරං පුස්කර රත්කර අඹරා තල තෙලෙන් පොවනු බිහිවෙයි. මළ කුණ වැටෙයි. කපුකොළ කොටා පොට්ටනි බැඳ තවනු වදත්. උඳුපියලියකොළ ලුනු දියෙන් පොවනු යටිබඩේ ගානු පෙකණියේ ගානු බිහිවෙයි. අමාරුවට කරන  වෙදකං ගල්කුරමුල් කරල්සැබෝමුල් ඉස සිට දෙපතුලට පිස පාමුල දමනු වදත්. මිටම නියඟලා අල සැවැන්දරා මුල් මී පැණියෙන් අඹරා නාබියේ යටිපල්ලේ යටිබඩේ, ඉස්මුදුනේ ගානු සැනෙකින් සෝදා හරිනු. මීටම නැගෙනහිරට ගිය පුහුල් මුල උදුරා ඉසේ බඳිනු වදත්.

## මළදරුවෝ වැටෙන්ඩ නිල බේත්

උතුරට ගිය එඬරුමුල උදුරා විල්ලඹු ගෑනිගේ අතට ගෙන දෝත පානු වදත්. මීටම බෙලිගහේ පිලිල ඇල් දියෙන් අඹරා පොවනු මළදරුවො වැටෙත්. පිටවක්කාමුල් තල තෙලෙන් දෙනු මළදරුවො වැටෙයි. මීටම උලුහාල් තලතෙලෙන් අඹරා පොවනු මළදරුවො වැටෙයි. '' ඕන්යෙලගුරුවා නෙස්වඃ''.ඉස්ගැනට වතුර මතුරා පොවනු. ඉස්ගැන හැරී සැපසේ වදයි. අත්දුටුවයි.

## වැදෑමහ වැටෙන්ඩ

වැදෑමහ වැටෙන්ඩ ලිපකින් අලුගෙන කුඩු ගසා භාජනයකට දමා දියකර ලුනු දිය සමග පොවනු වැදෑමහ වැටෙයි අත්දුටුවයි.

## ගර්භමූලිතෛලේට වගනම්

අඬහැර ඇහැල පේලිපරිත්තිය මුඩමහන වැල්පෙනෙලකොළ මිරිකා වැල්බැබිල නෙලුං අල ගොඩමානෙල් අල මෙ හැම යුස නැලිය නැලිය ගෙන හාතාවාරි අමුකහ මෙයුස පත පත ගෙන තලතෙල්, එලගිතෙල් එඬරු තෙල් නැලිය නැලිය ගෙන මීට දෙදුරු මෝද කොට්ටං පෙරුංකායන, තිවර්ගය සහිඳලුනු ඉඟුරු මිරිස් සුදුලුනු පතයි මේ හැම අඹරා තෙලට යොදා පුහුල් ඇඹුල් කසපැන් වතුර ඊට එක්කර ලනු වැටෙන පදමට කකාරා බා තබා පංගුවකට සුද්ධ ජයපාල දමා විරේක පත්තියං තනා තබා ගර්භිණීන්ගේ එක්වෙනි මාසෙට තැඹිලි දියෙන් දෙනු. දෙවැනි මාසේට කිතුල් හකුරෙන් දෙනු. තුන්වෙනි මාසේට උප්පැණියෙන් දෙනු. හතරවෙනි මාසෙට සීනි උප්පැණියෙන් දෙනු. පස්වෙනි මාසෙට පුහුල් ඇඹුලේන් දෙනු. සවෙනි මාසේට රත්නමාපලු දෙනු. හත් මාසෙට ඉඟුරු යුසින් දෙනු. අටවෙනි මාසේට විරේක තෙල් දොඩං ඇඹුලෙන් දෙනු. විරේක වූ විට පොල්කිරෙන් බත් දෙනු. සවස පත්තියං තෙල් දෙනු. නවවෙනි මාසේට සුදුහඳුන්වලින් දෙනු. දසවෙනි මාසෙට ඉඟුරු යුස මී පැණියෙන් විරේක තෙල් දෙනු. සවස පත්තියං තෙල් දෙනු. මින් ගුණ

ඇණුං ඇවිලිලි කොන්දේ බඬේ කැක්කුං ඉදිමුං කැසියා අතපය රුජාව මෙකී ලෙඩ ගුණවෙයි. වැදූ බිලිඳුන්ඩ රතුලුනු යුසිං රන්කිරි කටේ ගානු. කොරහට තෙල් දමා නැවත මළ දරුවෝ වැටෙන්ඩ දොඬං ඇඹුලෙන් විරේක තෙල් දෙනු. මළකුණ වැටෙයි අත්දුටුවයි. ගර්භමූලි තයිලේ නිමි.

## වැදෑමහ වැටෙන්ඩ

කොබ්බෑකොළ කොටා මිරිකා ලුනු දියෙන් දෙනු වැටෙයි. මීටම ඔලිඳ කොළ කොටා මිරිකා පොවනු වැටෙයි. මීටම රඹුක්බොඩ කොටා මිරිකා දෙනු වැටෙයි.

## ගර්භිණීන්ගේ කැස්සට

තිප්පිලි වී විලඳ දෙලුං ඇට සීනි මේවා අඹරා එලගිතෙලින් දෙනු. මීටම දියමෙනේරියකොළ අහුරයි ඔලිඳකොළ අහුරයි මේවා කොටා කසපැන් වතුරෙන් තම්බා මිරිකා පෙරා මීට උප්පැණි සීනි කිතුල් හකුරු වැල්මී කොට්ටං තිප්පිලි වී විලඳ දෙ දුරු මෝදක මේවා අඹරා යොදා කකාරා කල්ක කර දෙනු ගුණවෙයි.

## කුසපිළිකාවට කායම

කරඳකුඩු කුඩුමිරිස තොටිල්ල කුරුඳු මුරුංගා නික කුඹුරු කටුකරඹ බැබිල මෙකී මුල් කොටා තම්බා ඉස්මගෙන තලවඩි අරක්කු නැලියයි හිංගු ඉගුරු මිරිස් සුදුලූනු ලේවාලුනු නිතුල් සිවියමුල් මේවා අඹරා දමා කකාරා කායන්කර දෙනු මින් පන්ගුවකට ජයපාල දමා උදේට විරේක සවසට පත්තියමට දෙනු උනුදිය බොනු. මින් ගුණ බඬේ සියලු වායුවට ද ගෙඩි පෙරලෙනවාට ද සියලු විසාදියට ද රුදාවට ද ගුල්මයට ද බඬේ කැකකුමට ද ඇවිලෙනවාට ද උස්මුරුස්තාවට ද පිපුමට ද අජීර්ණයට ද සියලු සන්නිවලට ද බඩ මෝරනවාට ද මෙකී ලෙඩ වැදූ අයගේ ද නිකං අයගේද ගුණවෙයි සත්තයි.

## කුසපිළිකාවට වීරපත්‍රා කායම

කාමරංගා දෙහි දොඩං ලීම මෙකී ඇඹුල් පත පත ගෙන මීට යකිනාරං යකවනස්ස යක්වේරිය කුඩුමිරිස නික පඟුරු තිබ්බටු මෙකී මුල් ඉස්ම කකාරා දෙහිකොළ හීරැස්ස පලු ඉස්ම වක්කර අමුක්කරා අල සිවිය මුල් සාරණ වේලිපරිත්තියමුල් වදකහ ඉඟරු මිරිස් සුදුලූනු අබ ගොරක ත්‍රිපාල කුඹුරු ඇටමද දෙ දුරු පෙරුංකායන් ත්‍රිවිධ තිප්පිලි වැල්මී එනසල් මේ හැම අඹරා දමා හැන්දේ ඇලෙන කායන් තනා තබා උනු දියෙන් වළඳනු මින්ගුණ ස්ත්‍රින්ගේ සූවිස්සක් ගෙඩිද කැක්කුන් ද ගිනිහන් ද රුදාව ද වාතපිත්තා සෙලෙස්මන් පැවිති ලෙඩට වැදූගේ අයට ද නිකං අයටද යහපොති.

## කුසපිළිකාවට කායම

නික ගැටතුඹ හාතාවාරිය කුඹුරු මෙකී කොළ මොදගං ඉඟුරු මිරිස් ගෙඩි පතයි ගොරක පතයි මේවා කබලෙන් බැඳ අඹරා දමා කායන් තනා දෙවේලේ වළඳනු උනුදිය නොබොනු. මින්ගුණ බඩේ කැක්කුං රුදාව ද බඩේ ගෙඩිය ද අසාද්දියට බඩේ විසාදියටත් ලේ සාරේ යනවාට ද බඩිං යනවාට ද මෙකී ලෙඩ වැදූ අයටත් නිකන් අයටත් ගුණවෙයි.

## කුසපිළිකාවට

කපුකොළ මුල්ගෙන කොටා දියට එක්කර තම්බා මිරිකා පෙරා මීට දුරුදෙවගෙ මොදගං තිප්පිලි ඉගුරුමිරිස් හිංගු මේවා අඹරා යොදා කායන්කර දෙනු කුසපිළිකා ගුනවෙයි. කුසපිලිකාවට තෙලට වග නම් අට්ටික්කා රුක්අත්තන ඉවරග එරමුදු රත්මල් මෙකී පොතු ගොන්කැකිරිකොළ මුරුවාකොළ වල්බේත් මෙපමණක් ගෙන කොටා මිරිකා පොල්කිරි එක්කර මීට දෙදුරු මෝදගං තිප්පිලි ත්‍රිවිද හිංගු වැල්මී මෙකීවා අඹරා යොදා කකාරා පොල්තෙල් පදමට තෙල් සිඳ පෙරා තබා බොන්ට දෙනු. මින් ගුණන කුසපිලිකාවට නොයෙක් ගෙඩිවලට ද සිලන්දුවලට ද යහපොති අත්දුටුවයි මීට සස්සදමුල්

චතුසුද්දමුල් ගැටතුඹමුල් තිප්පිලිමුල් සුදුලූනු කැප්පෙටියාකොළ දෙහි ඇඹුල් එක්කර තලා මිරිකා ඉස්ම පොවනු. මීටම මී මුරුටු පල්මානිකං එළබටුකර කලාඳුරු පෙනල ගෙඩි පොතු, සුදුලූනු මෙවා අඹරා ගුලිකර තලතෙලින් දෙනු. කුසපිලිකාවට යක්වේරිය කොළ ඉස්මෙන් හීනටි හාල් කැඳපිස දෙනු ලූනු නැතිව දෙනු. අරුචි වී නම් පොල් සකුරෙන් මල්වා දෙනු. මීටම හීනටි හාල්පිටි එම කොළ ඉස්මෙන් දෙනු. මීටම බේදුරු අල රොඩු ගෙන වේලා චූර්ණකර හීනටි හාල් පිටි සමග අනා ගිතෙලින් කැවුං පිස වලදනු. මීටම පස්කුලුබඩු මෝරමාලු කායං පිස වලදනු. මීටම ඇත් කහ බැබිල, එලකහ සහිඳ ලූනු, ඇතුල්පැන ගහා පුරවලියං ගානු රතටයි. කුසපිලිකාවට යක්වේරිය කොළ ඉස්මෙන් හීනටි හාල් පිටි රොටී උයා වළදනු ගුණවෙයි. මීටම මී ගහේ බේදුරු අල කුණ ඇර කපා කොටා වේලා හීනටි හාල් එක්ක කොටා කබලෙන් බැද මීතෙලෙන් කැවුන් උයා දෙනු. මීටම ඉගුරු මෝදගං දෙදුරු ලසුනු මේවා කායං පිස දෙනු රත් පිත් අධික වීමෙන් මල මාර්ගයෙන් ලේ යනවාට ගුණයි. මීටම ඉරමුසු මුල් කලාඳුරු අල හාතාවාරිය අල ඉරිවේරිය මුල් මුද්දිරප්පලං වැල් මී මෙකී දේ පලම පලම ගෙන අට එකට කකාරා සීනි මී පැණියෙන් එක්කර දෙනු. මීටම උක්පැණි, මානෙල් අල නෙළුම් අල රේණු අලුකෙහෙල් මුනමල් මී නුග අරලු මුද්දිරප්පම් අද්දෙමට මුල් මෙකීවා අට එකට කකාරා සීනි මීපැණි මුසුව දෙනු, කුසපිලිකා ගුණවෙයි. අත්දුටුවයි.

### මළදරුවෝ වැටෙන්ඩ

මුරුංගා මල් පතක් විතර ගෙන කොටා හාතාවාරිය කොළ මිටයි මේවා කොටා මිරිකා තනහාල් දමා කැඳ උයා දෙනු. බිහිවෙයි. කහ තිප්පිලි ඇල් දියෙන් අඹරා පැසවා තුනටියේ යටි බඩේ ගානු වදත්. මීටම කපුකොළ මුල් කොටා කකාරා කාඩියෙන් දෙනු විගසට බිහිවෙයි. කුණ නමුත් වැටෙයි.

### වදන්ඩ බැරුවාට

එළබිංතඹුරු සහමුලින් ගෙන නියඟලා අල, වැල්කිඩාරන් අල, මෙකීවා අඹරා යටිපතුලේ ගානු වදත්. සෝදා දමනු. බැමිතිරිය

සහමුලින් ගෙන අඹරා ගිතෙලින් අනා බඩපිට ගානු. මළදරුවෝ වැටෙයි. තෝරගහක් උදුරා මුලඋඩ බලා බඩදරු අයට දක්වනු වදන්. මීකිරි පතක් කකාරා එලගිතෙල් වැල්මී සුදුහඳුන් මෙකීවා අඹරා පොවනු වදන්. ඌරල මුල් අඹරා ඇතුල් පතුල් වල ගානු වදත්. සාබෙට් ඇල්දියෙන් අඹරා යටිපල්ලේ ගානු වදත්.

කසපැන් දියත් රඹුක් ඉස්මත් ගර්භයා සැඟවුණු කල පොවනු සැනෙත් වදන්. කරල්සැබෝ මුල් අපත්ති මාර්ගයේ තබනු වදත්.

## මළදරුවෝ වැටෙන්ඩ

නියඟලා අල අඹරා ඇතුල්පතුල්වල ගානු වදත්. තලතෙල් පොවනු වදයි. තිප්පිලි කාඩිදියෙන් අඹරා එමෙන් දෙනු. මළ දරුවෝ වැටෙයි. මිරිස් පතක් බැද කුඩුකර පොල්කිරි පතකට යොදා පොවනු වදත් අත්දුටුවයි.

## බඩවැල පාත්උනාට

බඩවැල පාත්උනාට වගනම් තිප්පිලි කුඹුරු කුඩුයි අසමොදගන් වතුරේ ඉන්නා ගොලු බෙල්ලංගේ මස් තල්මල්පිංචි ඉඹුල්ගහේ මැලියං වගපුල් සුදුදුරු සහිඳ ලුනු මේවා එක එක කලඳ ගෙන කරඳ ඉස්මෙන් අඹරා නිකකොළ ඉස්මෙන් අඹරා ගුලිකර සෙවනේ වේලා කීලං මෝරු පතකිං දියකර පොවනු හැම වැදියාම ගුණවෙයි සත්තයි.

## වැදෑමහ වැටෙන්ඩ

වැදෑමහ වැටෙන්ඩ වග නම් කපු ඇට එමකොළ එම ගෙඩි මෙකී යුස නැලිය නැලිය ගෙන අබ ලුනු අඹරා දමා කාකාර දෙනු. වැදෑමහ වැටෙයි. හඳුන්ගලගා දෙනු. මීටම තුවක්කාකොළ හෝ මහ ගොං කැකිරි හෝ අඹරා දියකර පොවනු. වැදෑමහ වැටෙයි. මීටම නියඟලා තිත්තලබු ඇට නයිසැව කොට්ටං අබ මේ හැම එක පමණ ගෙන චූර්ණකර අපත්ති මාර්ගයෙවත් දුන්ගානු වැදෑමහ වැටෙයි. මීටම තිත්ත ලබු ඇට නයිහැව මේවා තලතෙලෙන් අඹරා දුන්ගානු වැදෑමහ වැටෙයි.

## මළදරුවෝ වැටෙන්ඩ

මළදරුවෝ වැටෙන්ඩ මුරුංගාමල් පතක් විතර ගෙන කොටා හාතාවාරියකොළ මිටයි මේවා කොටා මිරිකා තනහාල් දමා කැඳඋයා දෙනු බිහිවෙයි. කහත් තිප්පිලිත් ඇල්දියෙන් අඹරා පැසවා තුනටියේ යටිබඬේ ගාන වදත්. මීටම කපුකොළ මුල් කොටා කාකාරා දෙනු විගයට බිහිවෙයි. කුනු නමුත් වැටෙයි.

## වදන්ඩ බැරුවාට

එළබිංකුඹුරු සහමුලින්ගෙන නියඟලා අල වල්කිඩාරන් අල මෙකීවා අඹරා යටිපල්ලේ ගානු වදත්. සෝදා දමනු. බැම්තිරිය සහමුලින් ගෙන අඹරා ගිතෙලින් අනා බඩපිට ගානු මළදරාවෝ වැටෙයි. තෝරගහක් උදුරා මුල උඩබලා බඩදරු අයට කවනු වදත්. මී කිරි පතක් කකාරා එළගිතෙල් වැල්මී, සුදුහඳුන් මේවා අඹරා කලතා පොවනු වදත්. සාබෙටි ඇල් දියෙන් අඹරා යටිපල්ලේ ගානු වදත්. ඌරලමුල් අඹරා අතුල් පතුල්වල ගානු වදත්. කසපැන් දියෙන්වත් රඹුක්බොඩ ඉස්මෙන්වත් ගර්භයා සැගඋනුකල පොවනු සැනෙන්වදත්. කරල්සැබෝ මුල් අපත්ති මාර්ගයෙහි තබනු වදත්.

## වැදූගේ මාලේට

කුඹුරු බුලත් පලා කොසඹ විෂ්ණුක්‍රාන්තිය මෙකී කොළ මුරුංගාමුල් සාරණමුල් අමුක්කරාමුල් උණු දියෙන් අඹරා ඉඹුල් ඇට පමණ ගුලිකර සෙවෙනලා තබා අනු පැන බලා දෙනු.

## වැදූගේ සන්නියට තැම්බුම

තැම්බුමට දෙහි දොඩං යකිනාරං කුඹුරු නික කලුවෙල්ලංගිරිය යකවනස්ස ඇසල වරු ඉය මදුරු ලුනු අරණ වේලා කුඩුමිරිස කරපිංචා පාවට්ටා බුලත්පලා යක්වේරිය කොටා තම්බා මීට ඉගුරු මිරිස් ත්‍රිපල් ලසුනු හරංකා වදකහ කුඹුරුපුස් එරමුදු එඬරු මීක් කොසඹ මෙකී ඇට මේවා අඹරා පංගුවකට ජාපාල දමා අඹරා තැම්බූ ඖෂධ මිරිකා විරේකෙට පෙරුංකායං කොසඹ මුසුව දෙනු එයින්ම පත්තියං දෙනු.

## වැදූගේ ඉලප්පුවට අමුරටමිරිස් ගන්නා කසාය

වැදූගේ ඉලප්පුවට අමුරටමිරිස් ගන්නා කසාය වගනම් අමුරට මිරිස් නැටි නොකඩා පලු පිටින් නැලියක් ගෙන අප්පල්ලේට දමා වතුර නැලි අටක් වක්කර ඊට වැල්මී අක්‍රාපට්ටා සහිඳ ලුනු සින්නක්කාරන් කොත්තමල්ලි හඳුන් ඉඟිනි ඇට මේවා අට එකට කකාරා මී පැණි සමඟ දෙනු. මින්ගුණ ලපැත්තේ වේලි එන හතිකැක්කුමට සෙලෙසම හා ඉලප්පුවට ද අග්නි ඉලප්පුවට ද සන්නි ඉලප්පුවට ද කෝල ඉලප්පුවට ද මෙකී අටසීයයක් ඉලප්පු කැක්කුන් ගුණවෙයි. අත්දුටුවයි. පිට නොදෙනු.

## වැදූගේ ඉකිලි කැක්කුමට

වැදූ අයගේ දෙඩවිල්ලට ඔක්කාරෙට ඇඟ ගිනියමට යක්ෂ මායමට උණ විකාරෙට ඇඟ කැක්කුමට ඉකිලි කැක්කුමට කොන්දේ කැක්කුමට අතපය රුදාවට ඉසරදේය මෙකී ලෙඩට තලපත් කරුඳු හීන් එඬරු ගස්කැප්පෙටියා මුරුංගා මෙකී මුල් එක පමණ ගෙන කොටා දියවක්කර තම්බා මිරිකා පෙරා මීට උප්පැණි දෙහි ඇඹුලෙන් පතයි දොඩං ඇඹුල් පතයි ඊට එක්කර මීට දෙදුරු මෝද තිප්පිලි ත්‍රිවිද පෙරුංකායන් සහිඳලුනු ඉඟුරු මිරිස් වදකහ හරංකහ අබ ගොරක ත්‍රිපල් අමුක්කාරා අල මේවා අඹරා යොදා කකාරා සත් දවසක් දෙවේලේ දෙනු. පළමු කී ලෙඩ ගුණවෙයි.

## වැදූගෙට වදකහ කායම

අමු වදකහ කොසඹකොළ පොතු එළබටුකොළ මුල් පොතු පුඩුලුකොළ මුල් පෙනලකොළ මුල් ඉඟුරු කලාඳුරු අල මේවා යුසගෙන දෙදුරු මෝද ලසුන තිප්පිලි ත්‍රිවර්ණ පැපිලිය කොරාසානි මාසක්කා සතකුප්ප කොතඹුරු දේවදාර සින්නක්කාරං මිරිස් වදකහ අබ ත්‍රිපල් මේවා අඹරා යොදා තලප පදමට ආවිට පන්ගුවකට ජයපාල දමා කායන් පිස දෙනු. මින්ගුන වේලුන් කොන්ද බඩේ කැක්කුං ඉකිලි කැක්කුං කරඩු කැක්කුං ගිනි හා රුදා ඉදිමුන් තුං දොස් මෙකී ලෙඩ ගුනවෙයි.

## රඹුක්බොඩ කායම

රඹුක් බොඩ එම මුල් පොල්බෑවක කුඩු සමග කොටා තම්බා මිරිකා යුස නැලියක් ගෙන ලිප තබා දෙදුරු තිප්පිලි ත්‍රිවර්ග ත්‍රිපල් හිංගු සහිඳ ලූනු සින්නක්කාරං ඉඟුරු මිරිස් සුදුලූනු ගලිස් කුඹුරු ඇට කන්සාකොළ මෙකීවා අඹරා යොදා දොඩං දෙකක ඇඹුල් වක්කර කායන්කර පන්ගුවකට ජයපාල දමා තියා වලදනු. මින් ගුණ වැදූගෙයි බඩේ කැක්කුමට ද ඉසරදේට ද පෙරලෙනවාට ද කකියනවාට ද කන්කැන්කුමට ද අන්සයක් දිගේ යන රුදාවට ද ගිනියමට ද උනට ද මෙකී ලෙඩ ගුණවෙයි. වැදූගේ සන්නියට දෙදුරු මෝදක හිංගු ත්‍රිවර්ග උළුවා කොත්තමල්ලි, ත්‍රි කටුක ත්‍රිපැල අමු ඉඟුරු සපතයි සිවිය මුල් මුරුංගාමුල් තිරස්සවාලුමුල් අබ මිරිස් සුදුලුනු කොත්තමල්ලි ත්‍රි කටුක ත්‍රිපාල අමු ඉඟුරු සපතයි සිවියමුල් මුරුංගාමුල් අබ මිරිස් සුදුලූනු මේවා අඹරා තබා නික ලුනු අරණ යකිනාරං දෙහි දොඩං කුඩුමිරිස මෙකී කොළ මුල් කොටා තම්බා මිරිකා ලිප තබා පළමු ඇඹරු සරක්කු දමා කායන් පිස දෙනු. කාපු පසුව මී පැණි දිවේ ගානු. උයාපු හාලේ බත් තෝර මුකුණුවැන්න දෙනු.

## අංජනමට ර්ට තෙල

අංජනමට මූනමල් ඇට සුදුලුනු මේවා අඹරා අංජනං ලනු තෙලට ඉරමුසු බැබිල යකිනාරං යකවනස්ස යක්වේරිය තිබ්බටු මුරුංගා මීදි බෙලි කුරුඳු මෙකී මුල් කොටා තම්බා මිරිකා පෙරා ලිපතබා මීට තලතෙල් වක්කොට කාකාරා දේවදාර කම්බිලි පිලි උලුවා කොත්තමල්ලි ගලිස් හිඟුරුපියලි එනසල් ඉඟුරු අබ වදකහ සුදුලූනු සුදුදුරු මෝදගං සතකුප්ප හිංගු ෧මේවා අඹරා යොදා පදමට සිඳ ඉසේ අල්ලනු කන වක්කරනු වැදූගේ සන්නියට ගුනවෙයි.

## වැදූගේ සන්නියට

මීමිනිකුවක්කා වැල්පෙනලමුල් ඉඟුරු වල් අල මේ හැම යුසගෙන මාසක්කා සතකුප්ප කොත්තමල්ලි සීනක්කාරං දේවදාර කොරාසානි

ඉගුරු මිරිස් ත්‍රිපල් මේවා අඹරා යොදා අට එකට කකාරා දෙනු වැදූගේ සන්නි දහ අටම ගුණවෙයි. මීටම වරා වෙල්ලංගිරිය ඉරමුසු කලාඳුරු මිරිකුල සස්සඳ කුඩුමිරිස් යකවනස්ස තුඹ හාතාවාරිය මෙකී මුල් ත්‍රිකුලු තිපල් ත්‍රිවිද හිංගු මේ හැම කායන් පිස දෙනු. වැදූගේ සන්නි ගුණ වෙයි.

## වැදූගේ කායට

කායමට දෙදුරු මෝද ලසුනු හිංගු සාදික්කා කොත්තමල්ලි උලුවා හාල් අරලු සන්නිනායං ඇට ඉඟුරු මිරිස් ගොරක කරුඳුපොතු කුඹුරු නික කුඩුමිරිස කොසඹ මෙකී දලු ගලේ අඹරා දෙහි දොඩං ඇඹුල් වක්කර කැකැරෙන පදමට සරක්කු දමා කායන් පිස වැදූගෙට දෙනු උතුමී.

## වැදූගේ නැටි කසාය

නැටිකසායට තුඹනැටි මිරිස්නැටි බුලත් නැටි කොසඹ කරපිංච වන් ඇපල මෙකී නැටි මිට මිට ගෙන වදකහ හරංකහ ත්‍රිපල් ඉඟුරු මිරිස් හිංගු කොත්තමල්ලි කෙලිද ඇට තිප්පිලි අති උඩයන් දෙදුරු මේ හැම කොටා අට එකට එක්කර කකාරා දෙනු. වැදූගේ පිට සන්නි ඇතුලු සන්නි ගුණ වෙයි.

## වැදූගේ කරප්පමට

වැදූගේ කරප්පමට අතපය ඉදිමුනට කොසඹ තෙල් කලඳයි ලසුනු වදකහ හිංගු සාදික්කා මේවා අඹරා දමා තුන් දවසක් කකාරා තෙල් සිඳ කලඳ බැගින් වලඳනු පළමු කී ලෙඩ ගුණවෙයි.

## වැදූගේ බඩිං යනවාට

වැදූගේ බඩිං යනවාට නිකකොළ කහකොළ තුඹකොළ බුලත්කොළ යකවනස්ස වේලා මුරුංගා මෙකී මුල් එක පමණ ගෙන කොටා මිරිකා ලිප තබා දෙදුරු මෝදගං කොත්තමල්ලි පිසදෙනු. වැදූගේ බඩිං යනවාට රුජාවට කැක්කුමට ගිනියමට අරුචියට මෙකී ලෙඩ ගුණවෙයි.

**කසායට**

වෙල්ලංගිරිය සස්සඳ ඉරමුසු බෙලි නික කුඹුරු ලුනු අරන පඟුරු මිදි මෙකී මුල්ගෙන කොටා මිරිකා ලිප තබා දෙදුරු කොත්තමල්ලි කටුකරෝසන කොට්ටංවැල්මී ඉගුරු මිරිස් සුදුලූනු ත්‍රිපැල තිප්පිලි මේදේ අට එකට කකාරා ගිතෙල් මුසුව දෙනු. උන ගිනියං කැසි කාස ගැස්සුං ඇවිලිලි ගුණවෙයි.

**වැදූගෙට නැටි කසාය**

නිකනැටි ඉරිවේරියා පාවට්ටා කලාඳුරු ඉරමුසු සස්සඳ සැබෝ බැබිල කසඹිලියා මෙකී මුල් බෙලි කොසඹ කරපිංචා මුල් නැටි මේවා එක පමණට ගෙන කොටා ත්‍රිකටුක අබ සුදුලූනු, දෙදුරු මෝදක ත්‍රිවර්ග මේදේ අඹරා යොදා අට එකට කකාරා සීනි මුසුව දෙනු. මින්ගුණ වැදූගේ අයගේ ඇවිලිල්ලට ගිනියමට වෙව්ලුමට පිපාසෙට මෙකී ලෙඩ ගුණවෙයි. වැදූගේ බඩේ කැක්කුමට මුරුංගා පොතු අමු ඉගුරු සුදුලූනු වදකහ අබමිරිස් කුඹුරු පුස් ඇට පෙරුංකායන් කොත්තමල්ලි මේදේ අට එකට කකාරා දෙනු බඩේ කැක්කුන් අන්සයක් රුදාවට ඉකිලි රුදාවට කැක්කුමට ඔක්කාරේට යහපොති.

**වැදූගෙට නාරායන බස්නේ**

වැදූගෙට නාරායන බස්නේ වගනම් කොසඹ කුඹුරුමුල් නික කන්සාකොළ එරමුදුකොළ අරලු බුලු නෙල්ලි, ඉගුරු මිරිස් පෙරුංකායන් පුස්ප කුරුඳුපොතු කන්සා එරමුදු කුඹුරු පුස් එරමුදු අබ මෙකී ඇට මෙකීවා කොටා වේලා කොට්ටපොල් දමා කොටා කඩපිම්බේ තම්බා පැහෙන් මිරිකා බොන්නට දෙනු. ඇඟඉස බඳිනු කන වක්කරනු. මින්ගුණ වැදූ අයගේ නිකං අයගේ බඩේ කැක්කුමට ද උස්මුරුත්තාවට ද අංසයකින් එන වාත රුදාවට බඩගැට ගැහෙනවාට ද සන්නි රුදාවට ද උස්මුරුත්තාවට ද අංසයකින් එන වාත රුදාවට ද බඩ ගැට ගැහෙනවාට ද සන්නි රුදාවට ද කඳයට විහිදෙන අමාරුවට ද වමන බඩින් යනවාට ද ඇවිලිල්ලට ද ගිනියමට ද ඇනුමට ද ගිනි දානයට ද ගුල්ම රුදාවට ද පොලවලින් එන අන්ඩවායියට ද වැදූගේ

සන්නියට ද අපස්මාට සන්නියට ද කොන්ද බෙල්ලදිග යන සන්නියට මෙකී නොකී දහ අටක් සන්නි ගුණවෙයි.

## කපු ඇට කායම

කපු ඇට කායමට වගනම් කොසඹ කුඹුරු නික මුරුංගා වරා කරඳ කුඩු මිරිස ඉරමුසු මෙකී මුල් එක පමණ ගෙන කපු ඇට පතයි මේවා කොටා දිය වක්කර තම්බා මිරිකා පෙරා මීට ත්‍රිපල් ඉඟුරු මිරිස් සුදුලුනු අබ ගොරක දෙ දුරු තිප්පිලි ත්‍රිවිධ පෙරුම්කායම් සහිඳ ලුනු කොත්තමල්ලි උලුවාහාල් මෙ කීවා අඹරා දෙහි දොඩම් ඇඹුල් වක්කර කාකාරා කායම් කර පංගුවකට ජයපාල දමා විරේක පත්තියම් දෙනු. මින් ගුණ වැදූගේ බඩින් යනවාට ද බඩ පිපෙනවාට ද කොන්දේ කැක්කුමට ද අජීර්ණ බඩින් යනවාට ද උණ හිසරදයට ද කොන්ද බෙල්ල දිග යනවාට ද කලු අක්කකාරමට ද වැදූ අයගේ ද නිකන් අයගේ ද මෙකි අයගේ ලෙඩ ගුණ වෙයි.

## මහානාරයන බස්නය

මහානාරායන බස්නයට වගනම් වරා කුඩුමිරිස දෙහි දොඩම් කුඹුරු කොසඹ නවහන්දි රුක් අත්තන යටතෝඩු යකිනාරන් පඟුරු කරඳ ඉරමුසු නික කොට්ටු පාවට්ටා කවුඩු උඩත්තා ඉය දොඩම්පනා සස්සඳ පුපුල විෂ්ණුක්‍රාන්තිය යකවනස්ස යක්වේරිය යකාබැඳිය තුඹ කරපිංචා ලුණුවරන, අත්තන වේලා මල්දෙහි මෙකී දලු මිට මිට ගෙන ලියා වේලා කුඩුකර තබා අබ කුඩු හැලියයි කරඳ ඇට කුඩු හැලියයි පුහුල් ඔලිඳ ලබු වට්ටක්කා ඇසල දෙහි දොඩම් සියඹලා තම්මැන්නා අත්තන සන්නිනායන්, තෝරා මෙකී ඇට කරඹ කොසඹ ඇට, කුඩු හැලියයි මී ඇට කුඩු හැලියයි කොට්ට පොල් පතයි මේවා එකට කොටා තලතෙල් එඬරුතෙල් වලින් අනා ඊට සරක්කු තිප්පිලි සීනක්කාරන් පල්මානික්කම් සතකුප්ප කුරුඳු පෙරුම්කායන් හිගුරු පියලි ත්‍රිපල් ත්‍රිකටුක වේලා කහ හරංකහ දේවදාර වැල් මී උරුලෑගෙඩි මේවා කුඩු කර අනා වංඩුවෙන් තම්බා පැහෙන් මිරිකා බොන්නට දෙනු කන වක්කරනු නස්න කරනු. මින්ගුණ උණ ගිනියම් හති කැක්කුම් විකාර සන්නියට සී සැරුන් පිටගැස්සුම් අනුමුට්ටු

කැක්කුම් සීතල සන්නි කෝල විකාර කොන්දේ බඩේ පෙකණියෙන් දැල වරෙන් දෙකෙන්ඩා දෙකලවා දෙකෙන් පපුවෙන් බඩවැලෙන් රුදාවට කැක්කුමට ගිනියමට සන්නි වලිප්පුවට දෙමළ භාෂා විකාර වෙවුලුම් සන්නි වැදූගෙ දහ අටක් සන්නි අංශයන් තොර වුනාට දත් කැක්කුමට පිට ගැස්මෙන් මෙකී ලෙඩ ගුණවෙයි. සත්තයි. අත්දුටුවයි.

## වැදූගේ කිලිකුණ අඩස්සියට

වැදූගේ කිලිකුණ අඩිස්සියට, නික කොළ, තුඹ කොළ පතුක් මුල්, මෙකී ඉස්ම පත පත ගෙන එඬරු තෙල් පතයි මෝදගං අඹරා දමා හතර එකට කකාරා දෙනු. කිලිකුණ ඇරෙයි.

## වැදූ අංසයක් කොරේට

වැදූ අයගේ අංසයක් කොරේට අබ මිරිස් පතයි, තිප්පිලි කලඳයි, කංසා කොළ ඉස්ම නැලියයි, තලතෙල් නැලියයි, නිබ තෙල් මානාවයි මේවා ලනු වැටෙන පදමට කකාරා බා පෙරා වැදු අයගේ අංසයක් කොර උනාට ගානු කන වක්කරනු ඇඟ ඉස බඳිනු වැදූ අයගේ කොරේ ගුණවෙයි.

## වැදූගේ ඉකිලි කැක්කුමට

වැදූගේ ඉකිලි කැක්කුමට රුදාවට තුනටියේ කැක්කුමට ගිනියමට ගිනිපැරට නිකමුල්, පිටවක්කා, කොසඹ නැටි, වැල්කසබිලියා මුල්, අරලු නෙල්ලි, ඉඟුරු, තිප්පිලි, කරාඹු මෙකීවා කොටා කකාරා පොවනු වැදූ අයගේ උන ගිනියන් දියවී ගුණවෙයි.

## සමාලෝචනය

මහාසම්මත ගර්භවිධිය නමින් දේශීය හෝ ආයුර්වේදයට අයත් කෘතියක් ඇත්දැයි සොයි බැලීමි. **පූජ්‍ය පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල** හිමියන්ගේ **දේශීයය වෛද්‍ය ශබ්දකෝෂයේ** පෙරවදනෙහි ලංකාවේ පැරණි වෛද්‍ය ග්‍රන්ථ නාමාවලි දෙකක් ඇත. ඉන් එක් නාමාවලියක ග්‍රන්ථනාම 61ක් ද අනිකෙහි **භෙසජ්ජමංජුසාව** උපුටා ගනිමින් ග්‍රන්ථ

64ක නාම ලේඛනයක් ද වෙයි. එම ග්‍රන්ථ නාම 125 අතර **මහාසම්මත ගර්භවිධිය** මැයෙන් කෘතියක් නො එයි.

**ශ්‍රී ලාංකේය ආයුර්වේද ග්‍රන්ථ නාමාවලියේ** (රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව) වෛද්‍ය ග්‍රන්ථ 838ක් සම්බන්ධ විස්තර පවතී. ඒ අතර ද උක්ත නාමයෙන් කෘතියක් නොමැත. අපට හමුවූ පිටපත ගර්භිණී චිකිත්සාවට අදාළ විස්තරවලින් සමන්විත වෙයි. මෙහි කිහිප තැනක ඉතිවරයෝග රත්නාකරේ යනුවෙන් සඳහන්ව තිබිණ. ඒ අනුව වරයෝගරත්නාකරය මූලාශ්‍රය කරගනිමින් මේ කෘතිය නිර්මාණය කළේ ද යනු විමසා බැලීමි. **වරයෝගරත්නාකරය** හා **යෝගරත්නාකරය** යනු එකම පොතක් බව **සිංහල යෝගරත්නාකරයේ** (රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව 1997) හැඳින්වීමෙහි සඳහන් වෙයි. පද්‍ය 4561ක් අන්තර්ගත එම කෘතිය සිංහල වෛද්‍ය විද්‍යාවේ අත්පොතක්, මූල ග්‍රන්ථයක් වශයෙන් චිරප්‍රසිද්ධ ය.

ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 56ක් සඳහා ප්‍රතිකාර හා උපදෙස් සඳහන් **සිංහල යෝගරත්නාකරය** මුලුමනින්ම පද්‍යයෙන් ලියුවකි. එහි ගද්‍යයෙන් කිසිවක් නැත. ගර්භිණී චිකිත්සා සහ ස්ත්‍රී රෝග චිකිත්සා යනුවෙන් පරිච්ඡේද දෙකක් ඇතත් මහා සම්මත ගර්භවිධිය මැයෙන් යමක් හඳුන්වා නැත. අපට හමු වූ පිටපතේ කීපතැනකම යෝගරත්නාකරය මූලාශ්‍රය කරගෙන තිබුණු හෙයින් එහි සඳහන් ගර්භිණී චිකිත්සා සහ ස්ත්‍රී චිකිත්සා පරිච්ඡේද දෙක අධ්‍යයන කළමේ. එහි ගර්භිණී චිකිත්සා ක්‍රම මාතෘකා හතක් යටතේ පද්‍ය 46ක් යටතේ සඳහන්වෙයි. ස්ත්‍රී චිකිත්සා පරිච්ඡේදයේ මාතෘකා දොළසක් යටතේ පද්‍ය 186ක් රෝග ලක්ෂණ හා ප්‍රතිකාර වෙනුවෙන් දක්වා තිබේ. අපගේ නිදර්ශනයේ පද්‍යයෙන් සහ ගද්‍යයෙන් විස්තර බොහෝ ය. මහාසම්මත ගර්භවිධියේ ඇති කරුණු **යෝගරත්නාකරයෙන්** උපුටාගෙන ඇති බවට සාධක එහි ඇතත් කරුණු අනුව බොහෝ දේ එකිනෙකට වෙනස් ය. **යෝගරත්නාකරය** කෘතියේ බඩ මළදරුවන් වැටෙන්ට බෙහෙත් කිහිප තැනකම ඇත. එකී පද්‍යවලින් දෙකක් මෙසේ ය.

ලියනඟලා අල හෝ වං ඇපල මුල
බොරළු දමුණු මුල්වත් කල්ක මන කල
නාබි යටිපතුල් යෝනියේ ද ගෑ කල
බඩ මළදරු ගැබ වැටෙති කියති බල

ලබු බිජු වැටකොලු ද සප්සැව සහ අබද
අඹතෙල් වටා ඇරගෙන සිතු ලෙසට නද
ගැබ මළහොත් මේ දුම් පෑව ඉතු මගද
වහා වැටෙයි ගැබ මළ ඒ දරු බිළිඳ

පර්යේෂණයට බඳුන්කළ පුස්කොළ පිටපතේ මළදරුවෝ වැටෙන්ට බේත් ඇත්තේ මෙසේ ය. උළුවාහාල් අඹරා තලතෙලෙන් පොවනු. මළදරුවෝ වැටෙයි. මල්තුඹ අල මීතෙලෙන් බැද කවනු. බඩේ මළදරුවා වැටෙයි. ''සිනක්කාරං පුස්කර රත්කර අඹරා තල තෙලෙන් පොවනු. මළකුණු බිහිවෙයි. කපු කොළ කොටා මිරිකා පොට්ටනි බැඳ තවනු. වදත්. උදුපියලි කොළ ලුණු දියෙහි යටි බඩේ ගානු. බිහිවෙත්. මීටම නැගෙනහිරට ගිය පුහුල් මුල උදුරා ඉසේ බදිනු මළදරුවෝ බිහි වෙයි. උතුරට ගිය එඬරුමුල උදුරා විල්ලඹු ගැනිගේ අතට ගෙන දෝතපානු වදත්. මීටම බෙලි ගහේ පිලිල ඇල්දියෙන් අඹරා පොවනු මළදරුවෝ වැටෙත්.'' මළදරුවන් වැටෙන්ට බේත් ප්‍රතිකාර තවත් අපට ලැබුණ පුස්කොළ පිටපතේ ඇත.

**යෝගරත්නාකරයේ** නැති බොහෝ කරුණු බෝගහවැව පිටපතේ සඳහන් වෙයි. එම ඉදිරිපත් කරන පොතට තොරතුරු ලබාගෙන ඇත්තේ යෝගරත්නාකරයෙන් බව සඳහන් කර තිබීමත් ගද්‍යයෙන් බොහෝ කරුණු තිබීමත් අපට අලුත් අත්දැකීමකි. තවත් නිදසුනක් මෙසේය. "**ඉති වරයෝග රත්නගරේ සන්වාස විදිය කියත්** " යන්නයි. ප්‍රසිද්ධ **යෝගරත්නාකරයෙහි "සන්වාස විධි** " වශයෙන් තොරතුරක් නැත. එහෙත් අප ඉදිරිපත් කරන කෘතියේ සංවාස විධිය පද්‍යයෙන් දැක්වෙයි. කුසපිළිකා සම්බන්ධයෙන් ප්‍රතිකාර **යෝගරත්නාකරයෙහි** නැත. **මහා සම්මත ගර්භවිධියේ** කුසපිළිකා සඳහා දීර්ඝ වශයෙන් ප්‍රතිකාර ඇත. ඒවා පිළිබඳ තොරතුරු මෙහි අන් තැනක ඇත. විමසා බැලීමේදී මුද්‍රිත යෝගරත්නාකරයේ නොමැති බොහෝ විස්තර මෙහි තිබීම තුළින් පෙනී යන්නේ යෝගරත්නාකරයට අයත් විවිධ පිටපත් තිබෙන්නට ඇති බවයි. මෙහි ඇති ගද්‍ය කොටස වෙනත් තැන්වලින් ගත් කොටස් සහ යෝගරත්නකරයේ පද්‍ය ගද්‍යයට හැරවීමක් සේ ඇතැම් විට සිතිය හැකිය. එහෙත් යෝගරත්නකරයේ පද්‍යගෙන් ද කුස පිළිකාවට තොරතුරු නැත.

**බෝගහවැව පුස්කොළ** පිටපත නිර්මාණය කරන්නට ඇත්තේ පැරණි පුස්කොළ පොත් කිහිපයක් භාවිතයෙන් යැයි අනුමාන කළ හැකි ය. අත් වෙද පොත් සඳහා විවිධ පොත්වලින් තොරතුරු ලබාගෙන කුඩා පොත් සකසා ගෙන ඇති අයුරු මේ ක්ෂේත්‍ර තුළින් පැහැදිලි වෙයි. මෙය සියුම්ව පරීක්ෂා කිරීමෙන් මහා වෛද්‍ය ක්‍රමයන්ට අයත් නැති සිංහල ගැමි වෙදකමට අදාළ කරුණු මෙයින් හෙළිකර ගැනීමට පුළුවන් විය හැකි ය. මේ පිටපතේ **යෝගරත්නාකරය** ද මූලාශ්‍ර කරගෙන ඇති බවට සාධක ඇති හෙයින් අදාළ විෂය ප්‍රවීනයන්ට මෙය විශ්ලේෂණයට ක්ෂේත්‍රයක් වන්නේ යැයි හඳුන්වා දියහැකි ය. එමෙන් ම **සිංහල යෝගරත්නාකරය** නැවත සංස්කරණයේ දී මෙ බඳු තවත් පිටපත් ආශ්‍රයෙන් සංස්කරණය කිරීම යෝග්‍ය බව යෝජනා කරමු. අප්‍රකට පුස්කොළ පිටපතකින් හඳුනාගත් මෙම තොරතුරු අපේ උරුමයේ දේශීය දැනුම ගෙනහැර දක්වනු ලබන තවත් සාධකයක් බව නිගමනය කරමු. තව ද බලන්න, **බණ්ඩාර තිස්ස වයි. කේ. (2019) මහාසම්මත ගර්භවිධිය හෙවත් ගර්භිණී චිකිත්සා.- සේරි ප්‍රකාශන, කොළඹ 10.**

## ආන්තික සටහන්


1. කාරියවසම් තිස්ස, ශ්‍රී ලාංකික ආයුර්වේදයේ පැතිකඩක්, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2002, පිටුව 27.
2. සාරාර්ථසංග්‍රහ. - ප්‍රතිසංස්කාරක ආරියදාස කුමාරසිංහ, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ. 1987. පිටුව xxi - xxii.
3. කාරියවසම්, තිස්ස, එම , 2002, පිටුව 1.
4. ගල්මංගොඩ, සුමනපාල, යක්කල ආයුර්වේද අධ්‍යයන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය කැළණිය විශ්ව විද්‍යාලය, 2003, පිටුව 68.
5. ශිලාලේඛන සංග්‍රහය, බ්‍රහ්මචාරි ඩී. ඒ. වික්‍රමසූරිය මහතා විසින් සංගෘහිතයි, කොළඹ : ස්වදේශිමිත්‍රයා මුද්‍රණාලය, 1927, පිටුව 50.
6. ගල්මංගොඩ, සුමනපාල, එම, 2002, පිටුව 81.
7. ගල්මංගොඩ, සුමනපාල, එම, 2002, පිටුව 89.
8. සිංහල සාහිත්‍ය වංශය, සම්පාදක, පුංචිබණ්ඩාර සන්නස්ගල, කොළඹ : ලේක්හවුස් මුද්‍රණාලය, 1964, දෙවන මුද්‍රණය, පිටු 664-665.
9. කාරියවසම් තිස්ස, එම, 2002, පිටු 90.
10. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය,

සම්පාදක කේ. ඩී. සෝමදාස, කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, පිටුව 172.

11. චරක සංහිතාව, සම්පාදක, ආර්යදාස කුමාරසිංහ, කොළඹ, රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව 1994, පිටු 63 සහ 85.
12. සාරාර්ථ සංග්‍රහය, සම්පාදක, ආයසීදාස කුමාරසිංහ කොළඹ, ජාතික කෞතුකාගාර ප්‍රකාශනය, 1986, පිටු 190 - 210.
13. සිංහල වෛද්‍ය විද්‍යාව හා ශතස්ලෝකය, සම්පාදක, සරත් පී. අඹතලාව, කොළඹ, සමයවර්ධන, 1996, පිටු 1 - 17.
14. CATALOGUE OF THE SINHALESE MANUSCRPTS IN THE BRITISH MUSEUM- D. M. D .Z. WICKRAMASINGHE. LONDON-1900.
15. CATALOGUE OF THE CEYLONESE MANUSCRPTS IN DANISH COLLECTIONS. C.E GODAKUMBURA 1980.
16. සිංහල යෝගරත්නාකරය, රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව, කොළඹ. 1997.
17. භෙසජ්ජමඤ්ජුසාව, සම්පාදක. කේ. ඩී. කුලතිලක, මොඩන් පොත් සමාගම, කොළඹ. පිටු. එහි විෂය මාලාව අ - ඉ. 1962.
18. භෙසජ්ජමඤ්ජුසාව, සම්පාදක. කේ. ඩී. කුලතිලක, මොඩන් පොත් සමාගම, කොළඹ. ප්‍රස්තාවනාව, පිටුව. උ. 1962.